# 2025.08.14 වන දින මහ සභා රැස්වීම් වාර්තාව

2025.08.14 දින පෙරවරු 9.30 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ගරු සභාපතිතුමා :-

සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා සියලුම දෙනාට. අද දින මහ සභාව සඳහා පැමිණි, උප සභාපතිතුමිය, ජ්‍යේෂ්ඨ මන්ත්‍රිතුමන්ලා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා ඒ වගේම සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්, ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## පසුගිය වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමා :-

න්‍යායපත්‍රයට අනුකූලව ප්‍රථමයෙන්ම තිබෙන්නේ පසු ගිය මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම .

ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා :-

ගරු සභාපතිතුමනි,පසුගිය සභා වාර්තාවේ තීරණ අංක 06 යටතේ වැල්ලව නගරයට ආසන්න ස්ථාන එකක හෝ දෙකක ආදාහනාගාරයක් සහ මෘත දේහ තබා ප්‍රදර්ශනය කර තබන පාලර් එකක් ඉදිකිරීම සුදුසු බවට වශයෙන් සඳහන්ව තියෙනවා.ආදාහනාගාර එකක්ද දෙකක්ද වැල්ලව ප්‍රදේශයට?

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

යෝජනාවේ සඳහන් වෙන්නේ වැල්ලව නගරයට ආසන්නව එකම ස්ථානයක හෝ තැන් දෙකක ආදාහනාගාරයක් සහ මෘත දේහ ප්‍රදර්ශණය කර තබන පාලර් එකක් ඉදිකිරීම සුදුසු බවටයි.

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මහතා

පසුගිය සභා වාර්තාවේ වෙනත් කරුණු යටතේ අදහස් දැක්වීමේදී, ඉන්වෙන්ට්‍රියේ ඇතුලත් නමුත් භෞතිකව කාර්යාලයේ හෝ ගබඩාවේ නොමැති ලැප්ටොප් එකේ වර්ගය **AZUS VIVA I 5** වශයෙන් නිවැරදි වියයුතුයි.

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය :-

ගරු මන්ත්‍රීවරුන් දෙපල විසින් ඉදිරිපත් කල සංශෝධනයන්ට යටත්ව 2025.07.17 දිනැති මහසභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මහතා

එම යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක :- 01

2025.07.17 දින පැවති පළමු සභා රැස්වීම් වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා විසින් පෙන්වා දෙන ලද සංශෝධනය

තීරණ අංක 06 - වැල්ලව නගරයට ආසන්නව එකම ස්ථානයක හෝ තැන් දෙකක ආදාහනාගාරයක් සහ මෘත දේහ ප්‍රදර්ශණය කර තබන පාලර් එකක් ඉදිකිරීම සුදුසු බවට ගරු මහසභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

වෙනත් කරුණු යටතේ ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මහතා විසින් අදහස් දැක්වීම සම්බන්ධව පෙන්වා දෙන ලද සංශෝධනය

2021.12.07 දින ඉන්වෙන්ට්‍රියේ පිටු අංක 02 අනු අංක 16 යටතේ රු.248500.00 ක් වටිනාකමකින් යුතු **AZUS VIVA I 5** ලැප්ටොප් එකක් නිකුත් කරලා තියෙනවා.

යෝජනාව :- ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ස්ථිර :- ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මහතා

## විශේෂ නිවේදන

- මසකට දෙවරක් පවත්වන ජංගම සේවයේ දෙවන වැඩසටහන 2025.08.15 දින වත්තේගෙදර කොට්ඨාශයේදී අනෙකුත් ආයතනද සම්බන්ධ කරගනිමින් පැවැත්වීමට නියමිත බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.
- 2025.08.18 දින ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පොලිසිය,හමුදාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණයෙන් සාරගම වැව ශුද්ධ කිරීමේ සමාරම්භක වැඩසටහනක් පැවැත්වෙන බවත් එදිනෙන් ආරම්භ කර සතියක් පුරාවට සිදුකරන මෙම වැඩසටහන තුලින් එම කලාපය ආකර්ශනීය ස්ථානයක් බවට පත් කර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.
- 2025 පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත් වූ මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ වත්කම් බැරකම් ප්‍රකාශ 2025.08.18 දිනට පෙර කාර්යාලයට භාරදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

## ලිපි සංදේශ ඉදිරිපත් කිරීම

නැත.

## යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කර ඇති -

අලුතින් ඉදිකරන වැල්ලව ප්‍රාදේශීය සභා වෙළෙඳ සංකීර්ණය සම්බන්ධව

I. වැල්ලව ප්‍රා.ස.වෙළෙඳ සංකීර්ණයේ නිශ්චිත සැලැස්මක් අනුමත කර තිබේද?
II. එම ගොඩනැගිල්ල සඳහා වැයවන ඇස්තමේන්තුගත මුදලට එවකට මහසභා අනුමැතිය ලැබී තිබේද? එම මුදල කොපමණද?
III. මෙම ව්‍යාපාතිය නිම කිරීමට ගතවන කාලය කොපමණද?
IV. එම කාලයට අනුරූපව ඇස්තමේන්තුගත කර තිබේද?
V. මෙම ගොඩනැගිල්ලේ සැලැස්ම වෙනස් කර තිබේද?

එම ප්‍රශ්ණ සඳහා ලැබී ඇති පිළිතුරු පහත පරිදි වේ.

1.වැල්ලව ප්‍රා.ස වෙළෙඳ සංකීර්ණයේ නිශ්චිත සැලැස්මක් අනුමත කර තිබේද?

පිළිතුර -

ඔව්, වැල්ලව ප්‍රා.ස වෙළෙඳ සංකීර්ණයේ මූලික සැලැස්ම, මුළු පිරිවැය ඇස්තමේන්තුව හා පළමු අදියරයට අදාළ ඇස්තමේන්තුව සඳහා 2021.08.17 දින මහ සභා රැස්වීම් වාර්තාවේ තීරණ අංක 06 යටතේ මහ සභා අනුමැතිය ලැබි ඇත

2. එම ගොඩනැගිල්ල සඳහා වැයවන ඇස්තමේන්තුගත මුදලට එවකට මහසභා අනුමැතිය ලැබී තිබේද? එම මුදල කොපමණද?

පිළිතුර -

ඔව්, රු.408,682,440.76

3.මෙම ව්‍යාපෘතිය නිම කිරිමට ගතවන කාලය කොපමණද?

පිළිතුර -

ඉතිරි වැඩ සඳහා වැයවන මුළු පිරිවැය ඇස්තමේන්තුවට අදාල ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන් කළ හැකි නම් වසර එක හමාරක් තුළ ව්‍යාපෘතිය අවසන් කල හැක.

4.එම කාලයට අනුරූපව ඇස්තමේන්තුගත කර තිබේද?

පිළිතුර -

නැත, එක් එක් වර්ෂය තුළ වෙන් වන ප්‍රතිපාදන මත ඇස්තමේන්තු සකස් කිරීම සිදු කරන ලදි. එම ඇස්තමේන්තු සඳහා සභා අනුමැතිය ලැබී ඇත.

5.මෙම ගොඩනැගිල්ලේ සැලැස්ම වෙනස් කර තිබේද?

පිළිතුර -

2025.04.02 අවසන් ක්ෂේත්‍ර පරික්ෂාව හා ප්‍රගති සමාලෝචන රැස්වීමේදි ලබා ගත් තීරණ මත දූවන පඩිපෙල ඉවත් කර අමතර තරප්පු දෙකක් යෙදීමට තීරණය විය.සැලසුම් කළ එක් කඩකාමරයක වර්ග ප්‍රමාණය 800 **ft** ක් වන බැවින් ඒවා **key money** ක්‍රමය යටතේ තක්සේරු කිරීමේදි වටිනාකම ඉතා ඉහළ අගයක් ගන්නා බැවින් ඒවා අලෙවි කිරිම අපහසු වීම සලකා කඩ කාමරයක තක්සේරු වටිනාකම අවම කර ගැනිමේ අරමුණින් කඩ කාමරවල ප්‍රමාණය අඩු කර නැවත සැලැස්මක් ඉදිරිපත් කර ඇත. නමුත් මුල් සැලැස්මට අනුගතව ඉදිරි සංවර්ධන කටයුතු කිරිමටද මෙතෙක් සැලැස්මේ කිසිදු ඉදි කිරීමක් බාධාවක් වි නොමැත.

## <u>යථාපරිදි කල් දී ඇති යෝජනා</u>

## <u>යෝජනා අංක :- 01</u>

<u>ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර ඇති -</u>

ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතන වලට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් වන 2017.02.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 හි විධිවිධාන අනුව පුහුණුලාභියෙකුට ගෙවන ලද රු.500.00 ක දීමනාව , 2025.06.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2017(11) ට අනුව 2025.06.01 දින සිට රු.1,000.00 ලෙස සංශෝධනය කර ගෙවීම් කිරිම සඳහා ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

## <u>තීරණ අංක :- 02</u>

ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතන වලට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් 2025.06.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017(II) හි විධිවිධාන අනුව සභාවේ පුහුණු ලාභියෙකුට ගෙවන දීමනාව 2025.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.1,000.00 වශයෙන් සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතන වලට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් 2025.06.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017(11) හි විධිවිධාන අනුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ පුහුණු ලාභියෙකුට ගෙවන දීමනාව 2025.06.01 දින සිට ක්‍රියාත්මක

වන පරිදි රු.1,000.00 වශයෙන් සංශෝධනය කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

<u>යෝජනා අංක :- 02</u>

<u>ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර ඇති -</u>

756, හදිරවලාන ඉහල ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇති හදිරවලාන උඩයාර් මාවතේ අබුබක්කර් ජුම්මා පල්ලිය අසලින් ඇති මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් වශයෙන් පවරා ගැනිම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා</u>

ගරු සභාපතිතුමනි, හදිරවලාන උඩයාර් මාවතේ දැනට සංවර්ධන කටයුත්තක් සිදු වෙනවාද කියලා දැනගන්න කැමතියි.

<u>ගරු සභාපතිතුමා</u>

දැනට දැනුවත්ව නම් සංවර්ධන කටයුත්තක් සිදු වන්නේ නෑ.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.යූ. ප්‍රේම් කියාස් මහතා</u>

ගරු සභාපතිතුමනි, ඒ පාර දෙපස මෝටර් ග්‍රේඩර් කරල තියෙනවා. සභා අනුමැතියක් ඇතිවද ඒ කරල තියෙන්නේ කියලා දැනගන්න කැමතියි.

<u>ගරු සභාපතිතුමා</u>

ඒ සම්බන්ධව අපේ තාක්ෂණ නිලධාරින්ගෙන් පැහැදිලි කර ගැනීමක් සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු සභාපති එල්.පි.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

<u>ගරු සභාපතිතුමා</u>

එම ගැටළුව සඳහා පිළිතුරු ඉදිරියේදී ලැබේවි කියන අදහසින් නැවත මහසභාවක් බවට පත්වීම සඳහා යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභාව ගරු මහ සභාව බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## <u>තීරණ අංක 03</u>

756, හදිරවලාන ඉහල ග්‍රාම නිලධාරී වසම තුල පිහිටා ඇති හදිරවලාන උඩයාර් මාවතේ අබුබක්කර් ජුම්මා පල්ලිය අසලින් ඇති මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් වශයෙන් පවරා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව 756, හදිරවලාන ඉහල ග්‍රාම නිලධාරී වසම තුල පිහිටා ඇති හදිරවලාන උඩයාර් මාවතේ අබුබක්කර් ජුම්මා පල්ලිය අසලින් ඇති මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් වශයෙන් පවරා ගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.එම්.දිනූෂා මධුමාලි මිය

## <u>යෝජනා අංක :- 03</u>

<u>ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර ඇති -</u>

827, තෝරවතුර ග්‍රාමනිලධාරී වසමේ කොහිලේ ගෙදර කෝන්ගහ ගෙදර ප්‍රජා ශාලාව අසලින් ආරම්භ වන මාර්ගය ප්‍රාදේශීය සභා පොදු මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීම සුදුසු යැයි ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මයා</u>

ගරු සභාපතිතුමනි ගෙනා එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිර කුමාර මහතා</u>

ගරු සභාපතිතුමනි,මේ පාර ප්‍රජා ශාලාව අසලින් වමට ඇති පාරද, දකුණට ඇති පාරද යන්න දැනගතහැකිද? වමට ඇති පාර ප්‍රතිපාදන ලබා දීලා ප්‍රාදේශීය සභා පාරක් වශයෙන් සංවර්ධනය වෙලා තියෙනවා.සමහර පාරවල්වල නම් නැති තත්වය කවදහරි දවසක ගැටළුවක් බවට පත්වීමට පුළුවන් .

<u>ගරු සභාපතිතුමා</u>

එස්.පී.එච්.එච්.සතුරුසිංහ මහතා විසින් තමයි මේ පාර පොදු පාරක් ලෙස නම් කර විදුලිය ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් ඉල්ලීම කරලා තියෙන්නේ.

<u>ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිර කුමාර මහතා</u>

එස්.පී.එච්.එච්.සතුරුසිංහ මහතාගේ නිවස පිහිටා ඇති පාර නම් වමට ඇති පාර තමයි. එහෙම නම් වශයෙන් යෝජනාව දානවා නම් හඳුනා ගැනීම පහසුයි.

## <u>තීරණ අංක 04</u>

827, තෝරවතුර ග්‍රාමනිලධාරී වසමේ කොහිලේ ගෙදර කෝන්ගහ ගෙදර ප්‍රජා ශාලාව අසලින් ආරම්භ වන මාර්ගය ප්‍රාදේශීය සභා පොදු මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව 827, තෝරවතුර ග්‍රාම නිලධාරී වසමේ කොහිලේ ගෙදර කෝන්ගහ ගෙදර ප්‍රජා ශාලාව අසලින් ආරම්භ වන මාර්ගය ප්‍රාදේශීය සභා පොදු මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මයා

## <u>යෝජනා අංක :- 04</u>

<u>ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර ඇති -</u>

764, රංගම ග්‍රාමනිලධාරී වසමේ රංගම කෝන්පිටිය වත්තට යන මාර්ගය ප්‍රාදේශීය සභා පොදු මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා</u>

ගරු සභාපතිතුමනි, ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව මම ස්ථිර කරමි.

## <u>තීරණ අංක 05</u>

764, රංගම ග්‍රාමනිලධාරී වසමේ රංගම කෝන්පිටිය වත්තට යන මාර්ගය ප්‍රාදේශීය සභා පොදු මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව 764, රංගම ග්‍රාම නිලධාරී වසමේ රංගම කෝන්පිටිය වත්තට යන මාර්ගය ප්‍රාදේශීය සභා පොදු මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

## <u>යෝජනා අංක 05</u>

<u>ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර ඇති -</u>

ප්‍රාදේශීය සභාවේ 2025 අයවැය යෝජනා යටතේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් වන සූර්යතාපය උපයෝගී කරගනිමින් විදුලි බලය උත්පාදනය කර ගැනීම සඳහා ඒ සඳහා අයවැය මගින් වෙන් කර ඇති රු.10,000,000.00 ක ප්‍රතිපාදන සහ 2025 අයවැය මගින් සාරගම පුස්තකාලය ඉදිකිරීම සඳහා වෙන් කර ඇති මුදලින් වැයශීර්ෂ මාරු කිරීමක් මගින් සපයා ගනු ලබන රු. 6,000,000.00 ක ප්‍රතිපාදන යටතේ වැඩ අධිකාරී මහත්මිය විසින් ලබාදී ඇති වාර්තාවට අනුව වර්ග අඩි 1500 ක් වන ප්‍රධාන කාර්යාලයේ වහලය මත කි.වො.100 ක ධාරිතාවයකින් යුතු සූර්ය බලශක්ති පද්ධතියක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි,සාරගම පුස්තකාලය ඉදිකිරීමේ ප්‍රතිපාදන වලින් නම් අවශ්‍ය ඉතිරි මුදල ගන්නේ අයවැය මගින් වෙන් කර ඇති සාරගම පුස්තකාලය ඉදිකිරීම සඳහා ඉතිරි වන මුදල ප්‍රමාණවත් වෙයිද?

ගරු සභාපතිතුමා

ආදායමක් ලබන්න පුළුවන් කඩිනම් ව්‍යාපෘතියක් ලෙස තමයි මේ ව්‍යාපෘතිය යෝජනා කරන්නේ එහිදී සාරගම පුස්තකාලයේ දැනට තියෙන අඩුපාඩු සකස් කරලා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය තරම් මුදලක් ඉතිරි කරගෙන ලක්ෂ 60 ක් පමණ තමයි වැය ශීර්ෂ මාරුවක් මගින් මේ ව්‍යාපෘතියට ලබාගන්න බලාපොරොත්තු වෙන්නේ.දළ වශයෙන් මේ ව්‍යාපෘතිය සඳහා ලක්ෂ 160 ක් පමණ වැයවෙයි කියල තමයි විශ්වාස කරන්නේ.ඒ මුදල් සීමාව තුල තමයි ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කෙරෙන්නේ.

ගරු මන්ත්‍රී බී.එම්.කුමාරදාස  මහතා

ගරු සභාපතිතුමා , මේ පුස්තකාලය එක්කම පෙරපාසැලකුත් තිබෙනවා. ඒක නිරීක්ෂණය කල අවස්ථාවේදී  අපට පෙනුනේ ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය තැනක් ලෙසට.ඒ ගැනත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. .........(පැහැදිලි නැත)

ගරු මන්ත්‍රී ඩී.එම්.තරංගා දිසානායක මිය

ගරු සභාපතිතුමනි,ඔබතුමාගේ යෝජනාවට මමත් එකඟයි.නමුත් පුස්තකාලය සහ එම පෙරපාසැල සංවර්ධනය සඳහාත් අවශ්‍ය තරම් ප්‍රතිපාදන ලැබෙනවා නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

2025 වර්ෂයේ වැඩි කාලයක් දැන් ගෙවිලා .අයවැය මගින් පුස්තකාල,පෙරපාසැල් සංවර්ධනය සඳහා විධිමත් ක්‍රමවේදයක් යටතේ ලබන වර්ෂයේ ඉදන් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරමින් පවතිනවා. මේ වර්ෂය තුල සාරගම පුස්තකාල ගොඩනැගිල්ලේ අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරන ගමන් කාලීන අවශ්‍යතාවක් ලෙස මේ ව්‍යාපෘතිය කඩිනම් ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි, අපි නිරීක්ෂණ චාරිකාවක යෙදුනා සාරගම,කුඩාගල්ගමුව පුස්තකාලවල. එහිදී සාරගම පුස්තකාලයේ සංවර්ධන කටයුතු සඳහා දැනට වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් කියලා දන්වා සිටිනවා.

ගරු මන්ත්‍රී එච්.එම්.මහින්ද ජයලත්  මහතා

ගරු සභාපතිතුමනි, සාරගම ඔය කියන පෙර පාසැල තියෙන්නේ ග්‍රාම නිලධාරීන් 04 ම සිටින ගොඩනැගිල්ලේම වෙනම පොඩි කොටසක. මේ ග්‍රාම නිලධාරී කාර්යාල සංවර්ධනය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් රු. ලක්ෂ 19 ක් පාස්වෙලා දැනට සංවර්ධන කටයුතු ආරම්භ වෙලා තියෙනවා.

## තීරණ අංක 06

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2025 අයවැය යෝජනා යටතේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් වන සූර්යතාපය උපයෝගී කරගනිමින් විදුලි බලය උත්පාදනය කර ගැනීම සඳහා ඒ සඳහා අයවැය මගින් වෙන් කර ඇති රු.10,000,000.00 ක ප්‍රතිපාදන සහ 2025 අයවැය මගින් සාරගම පුස්තකාලය ඉදිකිරීම සඳහා වෙන් කර ඇති මුදලින් වැයශීර්ෂ මාරු කිරීමක් මගින් සපයා ගනු ලබන රු. 6,000,000.00 ක ප්‍රතිපාදන යටතේ වැඩ අධිකාරී මහත්මිය විසින් ලබාදී ඇති වාර්තාවට අනුව වර්ග අඩි 1500 ක් වන ප්‍රධාන කාර්යාලයේ වහලය මත කි.වො.100 ක ධාරිතාවයකින් යුතු සූර්ය බලශක්ති පද්ධතියක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ස්ථාපිත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2025 අයවැය යෝජනා යටතේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් වන සූර්යතාපය උපයෝගී කරගනිමින් විදුලි බලය උත්පාදනය කර ගැනීම සඳහා ඒ සඳහා අයවැය මගින් වෙන් කර ඇති රු.10,000,000.00 ක ප්‍රතිපාදන සහ 2025 අයවැය මගින් සාරගම පුස්තකාලය ඉදිකිරීම සඳහා වෙන් කර ඇති මුදලින් වැයශීර්ෂ මාරු කිරීමක් මගින් සපයා ගනු ලබන රු. 6,000,000.00 ක ප්‍රතිපාදන යටතේ වැඩ අධිකාරී මහත්මිය විසින් ලබාදී ඇති වාර්තාවට අනුව වර්ග අඩි 1500 ක් වන ප්‍රධාන කාර්යාලයේ වහලය මත කි.වො.100 ක ධාරිතාවයකින් යුතු සූර්ය බලශක්ති පද්ධතියක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ස්ථාපිත කිරිම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

## යෝජනා අංක :- 06

ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර ඇති -

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 (1), (2) වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභාවේ කුරුණෑගල හා මාස්පොත සහ මල්ලවපිටිය යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සඳහා ස්ථානමාරුවීම් ලැබ පැමිණ සේවයේ නියුතු පහත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට සහා බලප්‍රදේශය තුල රාජකාරි කටයුතු කරගෙන යාමට සභාව සතු බලතල පැවරීමට සහ සෞඛ්‍ය අංශයේ ප්‍රධානීන් ලෙස පත්කිරීමට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

කුරුණෑගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය

| නම | තනතුර | කොට්ඨාශය |
|---|---|---|
| වෛද්‍ය ඩී.එම්.අයි.ඩී.බී.හේරත් | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - කුරුණෑගල | |

| | | |
|---|---|---|
| වෛද්‍ය ජේ.ඒ.එස්.එච්.සේනාරත්න | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - මාස්පොත | |
| වයි.ජී.ඒ.ගුණවර්ධන | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වරද්දන |
| ඊ.එම්.එස්.ඒකනායක | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වැහැර |
| ඩී.අයි.සමරනායක | මහජන සෞඛ්‍ය පරීක්ෂක | මාස්පොත |

මල්ලවපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය

| නම | තනතුර | කොට්ඨාශය |
|---|---|---|
| එස්.එම්.කේ.එස්.බංඩාර | මහජන සෞඛ්‍ය පරීක්ෂක | මරළුවාව, වල්පොලකන්ද |

ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව මම ස්ථිර කරමි.

## තීරණ අංක 07

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 (1), (2) වගන්ති වලට අනුව ප්‍රාදේශීය සභාවේ කුරුණෑගල හා මාස්පොත සහ මල්ලවපිටිය යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සඳහා ස්ථානමාරුවීම් ලැබ පැමිණ සේවයේ නියුතු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට සභා බලප්‍රදේශය තුල රාජකාරි කටයුතු කරගෙන යාමට සභාව සතු බලතල පැවරීමට සහ සෞඛ්‍ය අංශයේ ප්‍රධානීන් ලෙස පත්කිරීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 (1), (2) වගන්ති වලට අනුව ප්‍රාදේශීය සභාවේ කුරුණෑගල හා මාස්පොත සහ මල්ලවපිටිය යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සඳහා ස්ථානමාරුවීම් ලැබ පැමිණ සේවයේ නියුතු පහත සඳහන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට සභා බලප්‍රදේශය තුල රාජකාරි කටයුතු කරගෙන යාමට සභාව සතු බලතල පැවරීමට සහ සෞඛ්‍ය අංශයේ ප්‍රධානීන් ලෙස පත්කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

කුරුණෑගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය

| නම | තනතුර | කොට්ඨාශය |
|---|---|---|
| වෛද්‍ය ඩී.එම්.අයි.ඩී.බී.හේරත් | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - කුරුණෑගල | |
| වෛද්‍ය ජේ.ඒ.එස්.එච්.සේනාරත්න | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - මාස්පොත | |

| | | |
|---|---|---|
| වයි.ජී.ඒ.ගුණවර්ධන | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වරද්දන |
| ඊ.එම්.එස්.ඒකනායක | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වැහැර |
| ඩී.අයි.සමරනායක | මහජන සෞඛ්‍ය පරීක්ෂක | මාස්පොත |

<u>මල්ලවපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය</u>

| නම | තනතුර | කොට්ඨාශය |
|---|---|---|
| එස්.එම්.කේ.එස්.බංඩාර | මහජන සෞඛ්‍ය පරීක්ෂක | මරළුවාව, වල්පොලකන්ද |

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය

## <u>යෝජනා අංක :- 07</u>

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද,</u>

ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරන සියළුම විදුලි පහන් සඳහා අදියර වශයෙන් හෝ සංවේදී ස්විච්(sencer switch) යෙදීමටත්,අනාගතයේ බලශක්ති අර්බුධයට පිළියමක් වශයෙන් සහ විදුලිය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් අවම කිරීමට හිරු එලියෙන් ආරෝපිත සෝලා විදුලි පහන් වලට යොමු වීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී එම්.ඩී.එන්.අනුරාධා රණසිංහ මිය</u>

එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා_විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

## <u>තීරණ අංක 08</u>

ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරන සියළුම විදුලි පහන් සඳහා අදියර වශයෙන් හෝ සංවේදී ස්විච්(sencer switch) යෙදීමටත්,අනාගතයේ බලශක්ති අර්බුධයට පිළියමක් වශයෙන් සහ විදුලිය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් අවම කිරීමට හිරු එලියෙන් ආරෝපිත සෝලා විදුලි පහන් වලට යොමු වීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.ඒ.අයි. තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව ප්‍රාදේශීයසභා සීමාව තුල ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරන සියළුම විදුලි පහන් සඳහා අදියර වශයෙන් හෝ සංවේදී ස්විච්(sencer switch) යෙදීමටත්, අනාගතයේ බලශක්ති අර්බුධයට පිළියමක්

වශයෙන් සහ විදුලිය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් අවම කිරීමට හිරු එළියෙන් ආරෝපිත සෝලා විදුලි පහන් වලට යොමු වීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි. තුෂාර චන්ද්‍රසේන මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එම්.ඩී.එන්.අනුරාධා රණසිංහ මිය

## යෝජනා අංක :- 08

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද.

බමුණුගෙදර කොට්ඨාශයේ බමුණුගෙදර ග්‍රාම සේවා වසමේ ක්‍රීඩාපිටියකට සුදුසුවේ යැයි ප්‍රදේශවාසීන් විසින් හඳුනාගෙන ඇති ඉතා දීර්ඝ කාලයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අතහැර දමා ඇති රජය සතු ඉඩමක සහ දාහිගමුව වසමේ සිටිලේන් නම් වූ වෙන්දේසි ඉඩමේ කුරුණෑගල ප්‍රාදේශීය සභාවට පවරා දී ඇති පර්චස් 100 ක් පමණ වූ ඉඩම් කොටසේ ක්‍රීඩා පිටිය බැගින් ඉදිකිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මම ස්ථිර කරනවා.බලප්‍රදේශයේ විශාලම ග්‍රාම නිලධාරී කොට්ඨාශය බමුණුගෙදර කොට්ඨාශයයි.ක්‍රීඩා පහසුකමක් නැතිව මේ ප්‍රදේශයේ බොහෝ පිරිසක් අසාධාරණයට ලක් වෙලා ඉන්නවා.මේක රජයේ ඉඩමක්ද දන්නෙ නෑ.නමුත් මේ ප්‍රදේශයට ක්‍රීඩා පිටියක් සකස් වීම අත්‍යාවශ්‍යම කාර්යයක්.ඒවගේම දාහිගමුව වසමේත් සභාව සතු කොටසේ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම හොඳ යෝජනාවක් කියල මම හිතනවා.

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා

ගරු සභාපතිතුමනි,පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන තේමාව යටතේ ශාරීරික හා මානසික සුවතාවය සඳහා ක්‍රීඩාව අත්‍යාවශ්‍යයි. මොකද මත්ද්‍රව්‍ය උවදුර සහ දූරකථනවලට තරුණ තරුණියන් ඇබ්බැහි වීමට ප්‍රධාන හේතුවක් තමයි ක්‍රීඩාවෙන් බැහැර වීම. ප්‍රාදේශීය සභාවක් විදිහට අපේ වගකීමක් තමයි සෞඛ්‍ය සම්පන්න දරුවන් රටට දායාද කිරීම.ඒ සඳහා තමයි මේ යෝජනාව ගෙන එන්නේ.

## තීරණ අංක 09

බමුණුගෙදර කොට්ඨාශයේ බමුණුගෙදර ග්‍රාම සේවා වසමේ ක්‍රීඩාපිටියකට සුදුසුවේ යැයි ප්‍රදේශවාසීන් විසින් හඳුනාගෙන ඇති ඉතා දීර්ඝ කාලයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අතහැර දමා ඇති රජය සතු ඉඩමක සහ දාහිගමුව වසමේ සිටිලේන් නම් වූ වෙන්දේසි ඉඩමේ කුරුණෑගල ප්‍රාදේශීය සභාවට පවරා දී ඇති පර්චස් 100 ක් පමණ වූ ඉඩම් කොටසේ ක්‍රීඩා පිටිය බැගින් ඉදිකිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව බමුණුගෙදර කොට්ඨාශයේ

බමුණුගෙදර ග්‍රාම සේවා වසමේ ක්‍රීඩාපිටියකට සුදුසුවේ යැයි ප්‍රදේශවාසීන් විසින් හඳුනාගෙන ඇති ඉතා දීර්ඝ කාලයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අතහැර දමා ඇති රජය සතු ඉඩම සභාව වෙත පවරා ගැනීමෙන් පසුව එම ඉඩමේ සහ දාහිගමුව වසමේ සිටිලේන් නම් වූ වෙන්දේසි ඉඩමේ කුරුණෑගල ප්‍රාදේශීය සභාවට පවරා දී ඇති පර්චස් 100 ක් පමණ වූ ඉඩම් කොටසේ ක්‍රීඩා පිටිය බැගින් ඉදිකිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

## යෝජනා අංක 09

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද,

බමුණුගෙදර කොට්ඨාශයේ බමුණුගෙදර ග්‍රාම සේවා වසමේ ප්‍රදේශවාසීන්ගේ කැලිකසල බැහැර කිරීම සම්බන්ධව ඇති වී තිබෙන ගැටළුකාරී තත්වය නිසා වරිපනම් අයකරගෙන හෝ කසල රැගෙන යාම සඳහා ට්‍රැක්ටර් රථ ලබාදීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එච්.ඊ.ඊ.එස්.ප්‍රභාෂණ මහතා

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක 10

බමුණුගෙදර කොට්ඨාශයේ බමුණුගෙදර ග්‍රාම සේවා වසමේ ප්‍රදේශවාසීන්ගේ කැලිකසල බැහැර කිරීම සම්බන්ධව ඇති වී තිබෙන ගැටළුකාරී තත්වය නිසා වරිපනම් අයකරගෙන හෝ කසල රැගෙන යාම සඳහා ට්‍රැක්ටර් රථ ලබාදීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව බමුණුගෙදර කොට්ඨාශයේ බමුණුගෙදර ග්‍රාම සේවා වසමේ ප්‍රදේශවාසීන්ගේ කැලිකසල රැගෙන යාම සඳහා ට්‍රැක්ටර් රථ ලබාදීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එච්.ඊ.ඊ.එස්.ප්‍රභාෂණ මහතා

## යෝජනා අංක 10

ගරු මන්ත්‍රී පී.කේ.බී.ප්‍රේමදාස මහතා විසින් ඉදිරිපත් කරන ලද.

ක්‍රීඩා පිටි සඳහා විශාල ඉල්ලුමක් පවතින නමුත්, සුදුසු ක්‍රීඩා පිට්ටනියක් සභාව සතුව නොමැති බැවින්,සහන මිලට කුලී පදනම මත ලබාදී කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය කර ගතහැකි වන පරිදි මෙට්‍රොපාර්ක් ක්‍රීඩාංගනය සංවර්ධනය කර ඒ සඳහා යෙදවීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී පී.කේ.බී.ප්‍රේමදාස මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මන්ත්‍රී බී.එම්.කුමාරදාස මහතා

ගරු සභාපතිතුමනි,ප්‍රේමදාස මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ඉතාමත් සාධනීය යෝජනාවක්.මේ වගේ පර්චස් 160 ක පමණ ප්‍රමාණයකින් යුතු ක්‍රීඩාපිටියක් මුළු කුඩාගල්ගමුව කෝරලයටම නෑ.මට අහන්න තියෙන්නේ මෙම ක්‍රීඩාපිටිය සංවර්ධනය කර කුලී පදනම මත ලබාදීමේදී ක්‍රීඩා පිටිය තියෙන ගමේ අයටත් බලපානවද කියලා.

ගරු සභාපතිතුමා

මේ යෝජනාවෙන් මූලික වශයෙන්ම අපේක්ෂා කරන්නේ මේ මොට්‍රොපාර්ක් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා මහසභාවේ එකඟතාවය ලබා ගැනීමයි. ඉන් පසුව මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී වැඩපිළිවෙලක් සැලසුමක් ඇතුව මහසභාව වෙත ඉදිරිපත් කරනවා.

ගරු මන්ත්‍රී ඊ.සංජය ඇතුගල මහතා

ගරු සභාපතිතුමනි,වේරවැල්ල ප්‍රදේශයේ ජනතාව ක්‍රීඩාව ගැන උනන්දුයි.වේරවැල්ල කටුපිටිය වත්තේ තියෙන ක්‍රීඩා පිටියත් සභාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ඉදිරියේදී නිශ්චිත වැඩපිළිවෙලක් ඔස්සේ සියළුම ක්‍රීඩාපිටි සභාවට පවරා ගැනීමට කටයුතු කරනවා.එම යෝජනාව සම්බන්ධවත් ඒ අවස්ථාවේදී කටයුතු කරමු.

## තීරණ අංක 11

ක්‍රීඩා පිටි සඳහා විශාල ඉල්ලුමක් පවතින නමුත්, සුදුසු ක්‍රීඩා පිට්ටනියක් සභාව සතුව නොමැති බැවින්,සහන මිලට කුලී පදනම මත ලබාදී කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය කර ගතහැකි වන පරිදි මෙට්‍රොපාර්ක් ක්‍රීඩාංගනය සංවර්ධනය කර ඒ සඳහා යෙදවිම සුදුසු බවට ගරු මන්ත්‍රී පී.කේ.බී.ප්‍රේමදාස මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව සහන මිලට කුලී පදනම මත ලබාදී කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය කර ගතහැකි වන පරිදි මෙට්‍රොපාර්ක් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී පී.කේ.බී.ප්‍රේමදාස මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා

## <u>යෝජනා අංක 11</u>

<u>ගරු මන්ත්‍රී කේ.ටී.වසන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද,</u>

කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සියළුම විශේෂ අවශ්‍යතා (කථන ආබාධ සහ ශ්‍රවණ ආබාධ)ඇති දරුවන්ට ඔවුන්ගේ රැස්වීම් පැවැත්වීම සඳහා එම දරුවන් වෙනුවෙන් සුදුසු ස්ථානයක ප්‍රජා ශාලාවක් ඉදිකර දීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී ඒ.ඒ.කුසුමාවතී මිය</u>

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී කේ.ටී.වසන්ත කුමාර මහතා</u>

ගරු සභාපතිතුමනි,මේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් දැනට ඔවුන්ගේ රැස්වීම් පවත්වන්නේ බණ්ඩාරනායකපුර උතුර ප්‍රජා ශාලාවේ.නමුත් විශාල ප්‍රදේශයක් ආවරණය වන මේ ප්‍රජා ශාලාවේ ගම්වැසියන්ගේ විවිධ රැස්වීම් පැවැත්වීම නිතරම සිදුවන නිසා මේ දරුවන් අපහසුතාවයට පත් වෙනවා .ඔවුනට වෙන රැස් වෙන්න තැනක් නැහැ. ඒ නිසා මේ සම්බන්ධව සභාවේ විශේෂ සැලකිල්ලක් දක්වන ලෙස ඉල්ලා සිටිනවා.

## <u>තීරණ අංක 12</u>

කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සියළුම විශේෂ අවශ්‍යතා (කථන ආබාධ සහ ශ්‍රවණ ආබාධ) ඇති දරුවන්ට ඔවුන්ගේ රැස්වීම් පැවැත්වීම සඳහා එම දරුවන් වෙනුවෙන් සුදුසු ස්ථානයක ප්‍රජා ශාලාවක් ඉදිකර දීම සුදුසු බවට ගරු මන්ත්‍රී කේ.ටී.වසන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සියළුම විශේෂ අවශ්‍යතා (ගොළු බිහිරි) දරුවන්ට ඔවුන්ගේ රැස්වීම් පැවැත්වීම සඳහා එම දරුවන් වෙනුවෙන් සුදුසු ස්ථානයක ප්‍රජා ශාලාවක් ඉදිකර දීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී කේ.ටී.වසන්ත කුමාර මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඒ.ඒ.කුසුමාවතී මිය

## යෝජනා අංක 12

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසි  ඉදිරිපත් කරන ලද,

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසල කළමණාකරණය සඳහා මහත් බාධාවක්ව පවතින ට්‍රැක්ටර් රථයක අවශ්‍යතාවය සපුරාලීම සඳහා අයවැය ප්‍රතිපාදන යටතේ වෙන් වී ඇති ප්‍රතිපාදන භාවිතයට ගනිමින් නව ට්‍රැක්ටර් රථයක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව මිලදී ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක 13

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසල කළමණාකරණය සඳහා මහත් බාධාවක්ව පවතින ට්‍රැක්ටර් රථයක අවශ්‍යතාවය සපුරාලීම සඳහා අයවැය ප්‍රතිපාදන යටතේ වෙන් වී ඇති ප්‍රතිපාදන භාවිතයට ගනිමින් නව ට්‍රැක්ටර් රථයක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව  ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව අයවැය ප්‍රතිපාදන යටතේ වෙන් වී ඇති ප්‍රතිපාදන භාවිතයට ගනිමින් නව ට්‍රැක්ටර් රථයක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව මිලදී ගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## යෝජනා අංක 13

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද,

බැකෝ ලෝඩරය HP 90 (JCB)  යන්ත්‍රය හා සෙසු යන්ත්‍රෝපකරණ කුලී පදනම මත සපයා ගැනීම සම්බන්ධව 2025.08.05 දිනැති මිලගණන් කැඳවීමේ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව මම ස්ථිර කරනවා

<u>ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි,ඔබතුමා විසින් ඉදිරිපත් කරන හදිසි යෝජනා සම්බන්ධව අපේ විරෝධයක් නෑ. නමුත් එම හදිසි යෝජනාව සභාව රැස්වන දිනයේ උදේ හෝ මේ අපේ මේසය මත ලිඛිත පිටපතක් වශයෙන් තිබුනනම් අපට ඒ ගැන දල අවබෝධයක් ගන්න පුළුවන් . ඊලග සභාවාරයේදීවත් මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ඉදිරියේදී එම යෝජනාව පිළිබඳව සලකා බලන්නම්.

## <u>තීරණ අංක 14</u>

බැකෝ ලෝඩරය HP 90 (JCB) යන්ත්‍රය හා සෙසු යන්ත්‍රෝපකරණ කුලී පදනම මත සපයා ගැනීම සම්බන්ධව 2025.08.05 දිනැති මිලගණන් කැඳවීමේ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව බැකෝ ලෝඩරය HP 90 (JCB) යන්ත්‍රය හා සෙසු යන්ත්‍රෝපකරණ කුලී පදනම මත සපයා ගැනීමේ,2025.08.05 දිනැති මිලගණන් කැඳවීමේ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

## <u>යෝජනා අංක 14</u>

<u>ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසි ඉදිරිපත් කරන ලද,</u>

2025.08.06 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු ලිපියට අනුව 2025 සැප්තැම්බර් මස 15 දින සිට 21 දින දක්වා පළාත් පාලන සතිය වැඩසටහන සඳහා සහ එම වැඩසටහන පැවැත්වීම සඳහා ලබාදී ඇති රු.145,000.00ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා</u>

ගරු සභාපතිතුමනි,හදිසි යෝජනාවක් වශයෙන් මහසභාවට ඉදිරිපත් කරන්නේ බලප්‍රදේශයේ ජනතාවට හදිසි ගංවතුරක්,විපතක්,විශේෂ ආපදාවක් වගේ අවස්ථාවකදී සභා අනුමැතියක් ගතයුතු කාරණයක් සම්බන්ධයෙන්.ට්‍රැක්ටරයක් මිලදී ගැනීම වුනත් සභාවේ ක්ෂණිකව පැනනැගුන අවශ්‍යතාවක් වෙන්න පුළුවන් නමුත් පළාත් පාලනයෙන් එවන පළාත් පාලන සතිය වගේ වැඩසටහන් සඳහා ක්ෂනිකව සභා අනුමැතිය ඉල්ලා සිටීම සුදුසු නැහැ.මේ වැඩසටහන් ගැන අපි දන්නේ නැහැ.කලින් අපව දැනුවත් කලා නම් අපිට කරුණු අරගෙන එන්න පුළුවන් කථා කරන්න. නොදන්න දෙයකට අත එසෙව්වා වගේ වෙන්න දෙන්න එපා.ඒ නිසා මෙවැනි හදිසි යෝජනා ඉදිරිපත් කිරීමේදී ගැටළු ඇතිවෙන්න පුළුවන්.

<u>ගරු සභාපතිතුමා</u>

පොදු කරුණක් හින්දා තමයි මේ යෝජනාව ගෙනාවේ කොහොම වුනත් මේ පළාත් පාලන සතිය යෝජනාවේ ඇස්තමේන්තුව ඉදිරි මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

<u>ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි,මේ මුදල් සම්බන්ධ කටයුතුනේ.මේවා සම්බන්ධව අපි දැනුවත් වීම වැදගත්.ඒ නිසා ඊලග වාරයේදිවත් හදිසි යෝජනා සම්බන්ධව ලිඛිතව අපිව දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

## <u>තීරණ අංක 15</u>

2025.08.06 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු ලිපියට අනුව 2025 සැප්තැම්බර් මස 15 දින සිට 21 දින දක්වා පළාත් පාලන සතිය වැඩසටහන සඳහා සහ එම වැඩසටහන පැවැත්වීම සඳහා ලබාදී ඇති රු.145,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව 2025.08.06 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු ලිපියට අනුව 2025 සැප්තැම්බර් මස 15 දින සිට 21 දින දක්වා පළාත් පාලන සතිය වැඩසටහන සඳහා සහ එම වැඩසටහන පැවැත්වීම සඳහා ලබාදී පහතින් සඳහන් කර ඇති රු.145,000.00ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

**<u>පළාත් පාලන සතිය 2025.09.15 සිට 2025.09.21 දක්වා වැඩසටහන් ඇස්තමේන්තුව</u>**

| අනු අංකය | දිනය | | ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් විස්තරය | පවත්වනු ලබන ස්ථානය | ඉලක්කගත සංඛ්‍යාව | අපේක්ෂිත වියදම |
|---|---|---|---|---|---|---|
| 1 | 2025.09.15 | ජංගම සේවා දිනය | 1.රාජ්‍යය ආයතන සම්බන්ධ කරගනිමින් මහජන සේවා සැපයීම.<br>• වීථි පහන් අලුත්වැඩියාව<br>• පරිසර ගැටලු පරීක්ෂාව<br>• ඉඩම් පිළිබඳ ගැටලු පරීක්ෂාව<br>• අනවසර ඉදිකිරීම් පිළිබඳ ගැටලු<br>• විවිධ සංවර්ධන යෝජනා ලබා ගැනීම්<br>• ජල හා සනීපාරක්ෂක ගැටලු | තල්විට කොට්ඨාශය<br><br>තල්විට විහාරස්ථානය | | රු.20,000.00 |
| | | | 2.සෞඛ්‍ය සායනය (බටහිර, ආයුර්වේද, අක්ෂි සායන) | | | |
| | | | 3.සෞඛ්‍ය උපදේශන වැඩසටහන | | | |
| | | | 4.මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු (මෝටර්ග්‍රේඩර් කිරීම) | | | |
| 02 | 2025.09.16 | සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය | 1.ගර්භනී මව්වරුන් සඳහා සෞඛ්‍ය වැඩසටහන<br>• ප්‍රජා අනුග්‍රහකත්වයෙන් කොළ කැඳ හා පෝෂණ මලු ලබා දීම<br>2. පෙර පාසල් දරුවන් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු දැනුවත් කිරීමේ වැඩසටහන<br>*ප්‍රජා දායකත්වයෙන් දරුවන් සඳහා කොළ කැඳ ලබා දීම<br>සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම | තෝරයාය කොට්ඨාශය<br><br>ඇවලෝන් වත්ත ප්‍රජා ශාලාව | | රු.20,000.00 |
| | | | 3.ප්‍රජාව සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු පිළිබඳ දැනුවත් කිරීම | | | |
| | 2025.09.16 | | 4. සෞඛ්‍ය සායන (ආයුර්වේද සායන)<br>• ඖෂධීය කොළ කැඳ ලබා දීම | ඇවලෝන් වත්ත ක්‍රීඩා පිටිය | | |
| | | | 5.එක් දින වොලිබෝල් පුහුණු කඳවුරක් පැවැත්වීම | | | |
| | | | 6.දම්බඩවත්ත පොදු ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස මෝටර් ග්‍රේඩර් කිරීම | | | |
| | | | 7. මාර්ග අනතුරු වලක්වාලීම සඳහා රියදුරු මහතුන් | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | වෙනුවෙන් උපදේශන වැඩසටහන් | | | |
| 03. | 2025.09.17 | ආදායම් ප්‍රවර්ධන දිනය | 1.වරිපනම්/ව්‍යාපාර බදු ගෙවන්නන් සඳහා **whatapp group** නිර්මාණය කිරීම | යන්තම්පලාව කොට්ඨාශය | | රු.10,000.00 |
| | | | 2. ආදායම් ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම(ප්‍රචාරණ,ඒකක මට්ටමින් වරිපනම් බදු මුදල් එකතු කිරීම) | | | |
| 04 | 2025.09.18 | මහජන උපයෝගීතා සහ ක්‍රීඩා දිනය | 01.වීථි පහන් නඩත්තුව (අකරගන දකුණ, දඹකන්ද වත්ත, රත්ගල්ල) | බෝයගනේ කොට්ඨාශය | | රු 10,000.00 |
| | | | 02.ක්‍රීඩාපිටි සංවර්ධනය (දඹකන්ද වත්ත, රත්ගල්ල) | | | |
| | | | 03.සුසානභූමි සංවර්ධනය (රත්ගල්ල, වෙරළුගොල්ල) | | | |
| | | | 04.මාර්ග අලංකරණය සඳහා කරද පැළ සිටුවීම ( හාල් පාර ගෙපල්ලව හංදිය සිට වන පර්යේෂණ ආයතනය) | | | |
| 05 | 2025.09.19 | පරිසර හා රුක් රෝපණ දිනය | 01.පරිසරය සුරැකීම සම්බන්ධ පාසල් දරුවන් හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන්/රුක් රෝපණ වැඩසටහන (දොරටියාව සහ බෝගමුව විද්‍යාලය) | දොරටියාව කොට්ඨාශය | | රු.35,000.00 |
| | | | 02.නොදිරන කසළ එකතු කිරීමේ වැඩසටහන පැවැත්වීම | | | |
| | | | 03.මාර්ග දෙපස අවිධිමත් කසල එකතු කිරීමේ වැඩසටහන | | | |
| | | | 04.ආහාර සුරක්ෂිතතාවය සඳහා පොදු ඉඩම්වල පළතුරු පැළ රෝපණය කිරීමේ වැඩසටහන | | | |
| | | | 05.ජල පෝෂක ප්‍රදේශ තුළ රුක්රෝපණය කිරීම (වෙන්නොරුව වැව) | | | |
| | | | 06.**3R** සංකල්පය සම්බන්ධව **(Reduse, Reuse, Recycle)** වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරීම | දොරටියාව කොට්ඨාශය | | |
| | | | 07.ගෘහස්ත කොම්පෝස්ට් නිෂ්පාදනය ප්‍රවර්ධනය කර ව්‍යවසායකයින් නිර්මාණය කිරීම හා කොම්පෝස්ට් බඳුන් ලබාදීම | | | |
| 06. | 2025.09.20 | අධ්‍යාපන හා පුස්තකාල ප්‍රවර්ධන | 01.පුස්තකාල තරඟ පැවැත්වීම | කුඩාගල්ගමුව කොට්ඨාශය | | රු.25,000.00 |
| | | | 02.පෙරපාසල් දරුවන් කියවීම ප්‍රගුණ කිරීම සඳහා පුස්තකාලය තුළ කතන්දර පැය වැඩසටහන | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | දිනය | පැවැත්වීම | | | |
| | | | 03.පොත් ප්‍රදර්ශන පැවැත්වීම | | | |
| | | | 04.අනුග්‍රහකත්වය ලබාගනිමින් නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබාදීම | | | |
| | | | 05.පාඨක සමාජය හරහා පුස්තකාලය තුළ ශ්‍රමදාන පැවැත්වීම | | | |
| 07 | 2025.09.21 | ක්‍රීඩා දිනය සහතික පත්‍ර ප්‍රදානය | 01. අන්තර් කොට්ඨාශ වොලිබෝල් තරඟය, යෞවන සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීමේ වැඩසටහන පැවැත්වීම | උයන්දන මහජන ක්‍රීඩාංගණය | | රු.25000.00 |
| | | | මුළු එකතුව | | | රු.145,000.00 |

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## යෝජනා අංක 15

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු ZA-4979 දරණ බැකෝ ලෝඩරය සභාවේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා කඩිනමින් යෙදවීමට අවශ්‍ය බැවින් එහි වාර සේවාව සිදු කිරීම හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා එම යන්ත්‍රය නිෂ්පාදිත ආයතනය වන ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු, අනුමත කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

ගරු සභාපතිතුමනි, ඔබතුමා විසින් ගෙනෙන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක 16

කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු ZA-4979 දරණ බැකෝ ලෝඩරය සභාවේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා කඩිනමින් යෙදවීමට අවශ්‍ය බැවින් එහි වාර සේවාව සිදු කිරීම හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා එම යන්ත්‍රය නිෂ්පාදිත ආයතනය වන ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු, අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු ZA-4979 දරණ බැකෝ ලෝඩරය සභාවේ මාර්ග

සංවර්ධන කටයුතු සඳහා කඩිනමින් යෙදවීමට අවශ්‍ය බැවින් එහි වාර සේවාව සිදු කිරීම හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා එම යන්ත්‍රය නිෂ්පාදිත ආයතනය වන ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් ඇස්තමේන්තු, පිළි ගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

ZA-4979 දරණ බැකෝ ලෝඩරයේ වාර සේවාව සිදු කිරීම සඳහා - රු. 334669.18

ZA-4979 දරණ බැකෝ ලෝඩරයේ අළුත්වැඩියාවන් සිදු කිරීම සඳහා -රු. 231366.35

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

## යෝජනා අංක 16

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

ප්‍රධාන කාර්යාලයේ ඇති ආපන ශාලාවේ වසර 03 ක බදු කාලය 2025.09.30 දිනෙන් පසුව අවසන් වීමට නියමිතව තිබූ නමුත් මාසික කුලී මුදල් නොගෙවීම මත ගිවිසුම් කාලය අවසන් කර ඇති නිසා නව බදුකරුවෙකු තෝරාපත් කර ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක 17

ප්‍රධාන කාර්යාලයේ ඇති ආපන ශාලාවේ බදු කාලය 2025.09.30 දිනෙන් පසුව අවසන් වීමට නියමිතව තිබූ නමුත් මාසික කුලී මුදල් නොගෙවීම මත ගිවිසුම් කාලය අවසන් කර ඇති නිසා නව බදුකරුවෙකු තෝරාපත් කර ගැනීම සඳහා ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ප්‍රධාන කාර්යාලයේ වාර්ෂික කුලී මුදල ප්‍රතිශෝධනය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බැවින් එය ලැබෙන තෙක් පවතින වාර්ෂික අවම ලංසු මුදලට ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ වසර 03 ක කාලසීමාවක් සඳහා විවෘත මිල කැඳවීමක් සිදු කර බදුකරුවෙකු තෝරා ගැනීමටත්,නව තක්සේරු වටිනාකම අනුව ගාස්තු සංශෝධනයක් වන බව සහ මෙම ආපන ශාලාව පෙ.ව.6.00 සිට රාත්‍රී 10.00 දක්වා විවෘතව තැබිය හැකි බව ප්‍රසම්පාදන දැන්වීමට ඇතුලත් කිරීමත් සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

## යෝජනා අංක 17

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

සභාවේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා බොරළු මිලදී ගැනීමට සහ කුලී පදනම මත මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර සපයා ගැනීම සඳහා සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් සහ වයඹ පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත දෙවතාවක් මිලගණන් කැඳවීම කලද, කිසිදු මිලගණනක් ලැබී නැති අතර මෙම තත්වය, ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වලට බාධාවක් වී ඇති බැවින්, විවෘත මිල කැඳවීම් යටතේ දින 07 ක් කල්දී බොරළු සපයා ගැනීමට හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර කුලී පදනම මත සපයා ගැනීම සඳහා පිළිගත් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ මිල කැඳවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා

## තීරණ අංක 18

සභාවේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා බොරළු මිලදී ගැනීමට සහ කුලී පදනම මත මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර සපයා ගැනීම සඳහා සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් සහ වයඹ පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත දෙවතාවක් මිලගණන් කැඳවීම කලද, කිසිදු මිලගණනක් ලැබී නැති අතර මෙම තත්වය, ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වලට බාධාවක් වී ඇති බැවින්, විවෘත මිල කැඳවීම් යටතේ දින 07 ක් කල්දී බොරළු සපයා ගැනීමට හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර කුලී පදනම මත සපයා ගැනීම සඳහා පිළිගත් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ මිල කැඳවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව විවෘත මිල කැඳවීම් යටතේ දින 07 ක් කල්දී බොරළු සපයා ගැනීමට හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර කුලී පදනම මත සපයා ගැනීම සඳහා පිළිගත් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ මිල කැඳවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

## යෝජනා අංක 18

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ එක් එක් අංශයන්හි සිදු කරනු ලබන වැඩවිෂයන්හි පවතින ගැටළු අවම කර ගැනීම සඳහාත්, ප්‍රජාව සමග මනා සහසම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහාත් එම කටයුතු අධීක්ෂණය හා නියාමනය කිරීමට ගරු මහසභාව නියෝජනය කරන මන්ත්‍රී මණ්ඩලයේ 13 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සුදුසු බවත්,එම කමිටු වල අවශ්‍යතාවය මත තවත් මන්ත්‍රීවරුන් අවශ්‍ය වන්නේ නම් ගරු සභාපතිතුමාගේ අභිමතය පරිදි සුදුසු මන්ත්‍රීවරුන් පත් කර ගැනීම සඳහාත් ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එච්.ඊ.ඊ.එස්.ප්‍රභාෂණ මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

පැහැදිලි කිරීමක් කරන්නම්.අපේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය අනෙකුත් ප්‍රාදේශීය සභා එක්ක ගත්තම වඩාත් සංකීර්ණ සමාජීය,ආර්ථික වටපිටාවක් තියෙන බලප්‍රදේශයක්.මහජනතාවගේ පැත්තෙන් එන යෝජනා, චෝදනා වැඩිවෙමින් පවතින බව පේනවා.මහජනතාවගේ පැත්තෙන් එන සංවර්ධන යෝජනා, ඉල්ලීම් චෝදනා සම්බන්ධව, මහජන නියෝජිතයන් වශයෙන් මා වෙනුවෙන්, එවා සම්බන්ධව වගකීමකින් යුක්තව සොයා බලල ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිලධාරීන්ට සහය වීම සඳහා තමයි මේ කණ්ඩායම එක් එක් විෂය ක්ෂේත්‍ර සඳහා පත් කරන්නේ.සභාවේ නිලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කරමින්,මගේ කාර්යබහුලතාවයට යම් විසඳුමක් විධිහටත්, කාර්යක්ෂමව ජනතාවගේ ගැටළු වලට පිළිතුරු සැපයීම සඳහා නිලධාරීන්ට සහය වීමත් තමයි ඔවුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ. ඉදිරියේදී ඒ ඒ විෂය ක්ෂේත්‍ර වල තියෙන වැඩපරිමාව අනුව ඔවුන්ට එම කාර්යභාරය තනිවම ඉටුකිරීම අපහසුනම් මගේ අභිමතය පරිදි ,ක්ෂේත්‍රය පිළිබඳව අවබෝධයක් සහ දැනුමක් ඇති මන්ත්‍රීවරුන්, ඔවුන්ට සහය දැක්වීම සඳහා පත්කිරීමට අපේක්ෂා කරනවා.

ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්.මීන් පෙර මෙවැනි යෝජනාවක් කිසිම සභාපතිවරයෙක් ඉදිරිපත් කරලාත් නැහැ.සභාවෙන් ඇවිල්ලත් නෑ.එක්කෙනෙක් අතේ බලය තබාගෙන තමයි කටයුතු කලේ.මෙතනින් වෙන නීතිමය කටයුතු සහ සේවාවන් ඉටු කිරීම කාර්යක්ෂම කිරීම සඳහා මෙතුමා කටයුතු කරලා තියෙනවා.හැබැයි නිලධාරීන් එක්ක ඉතාම සුහදශීලීව මේ කටයුත්ත කරන්න ඕනෑ. ගැටුම් ඇති නොවන පරිදි.මේ ක්‍රියාවලිය තුල මම දැක්කා කුඩාගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට වීථි පහන, දින දෙකයි අක්‍රිය වෙලා තිබුනේ. ඉතාම කඩිනමින් දැන් අළුත්වැඩියා කරල තියෙනවා.ඉතාම සතුටුයි.මමත් ඒ විදුලි පහන කිහිපවතාවක් අළුත්වැඩියා කරලා තියෙනවා. කවුරුහරි ඒ වැඩ කරන්න ඕනෑ.මම මධ්‍යස්ථ පුද්ගලයෙක්. මේ මාස

කීපය තුල ඔබතුමා ගත් පියවරයන් තුලින්, මම සතුටු වෙනවා ඔබතුමා ඔය පුටුවට පත්වීම පිළිබඳව.හැබැයි මන්ත්‍රීතුමන්ලා නිලධාරීන් එක්ක ගැටුමක් ඇති නොවන විධිහට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

## තීරණ අංක 19

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ එක් එක් අංශයන්හි සිදු කරනු ලබන වැඩවිෂයන්හි පවතින ගැටළු අවම කර ගැනීම සඳහාත්,ප්‍රජාව සමග මනා සහසම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහාත් එම කටයුතු අධීක්ෂණය හා නියාමනය කිරීමට ගරු මහසභාව නියෝජනය කරන මන්ත්‍රී මණ්ඩලයේ 13 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සුදුසු බවත්,එම කමිටු වල අවශ්‍යතාවය මත තවත් මන්ත්‍රීවරුන් අවශ්‍ය වන්නේ නම් ගරු සභාපතිතුමාගේ අභිමතය පරිදි සුදුසු මන්ත්‍රීවරුන් පත් කර ගැනීමටත් ගරු සභාපති ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහසභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත පරිදි ඒ ඒ අංශ වලට ගරු මන්ත්‍රීවරුන් පත්කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

01.ආදායම්, නව ආදායම් හඳුනාගැනීම හා ඩිජිටල්කරණය - ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මයා

02.විගණන විමර්ශන හා ප්‍රසම්පාදන කටයුතු - ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මයා

03.කර්මාන්ත ව්‍යාපෘති - ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

04. ප්‍රජා සංවර්ධන පරිසර හා පොදු පහසුකම් -ගරුඋපසභාපති ජී.ඒ.සී.ප්‍රසාදිනී රත්නවර්ධන මිය

05. ඉඩම් හා ගොඩනැගිලි - ගරු මන්ත්‍රී පී.කේ.බී.ප්‍රේමදාස මයා

06.වෙන්දේසි ඉඩම් - ගරු මන්ත්‍රී එච්.එම්.මහින්ද ජයලත් මයා

07.වාහන පරිහරනය හා වාහන නඩත්තු - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

08.විදුලිය හා වීථි පහන් නඩත්තුව - ගරු මන්ත්‍රී එස්.එම්.සී.ජයවිලාල් බණ්ඩාර මහතා

09.පොදු පරිපාලන - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

10. අයවැය සකස් කිරීම හා ආයතන මූල්‍ය කළමණාකරණය - ගරු මන්ත්‍රී ඩී.එම්.එස්.හර්ෂණ මහතා

11.සෞඛ්‍ය හා කසල කළමණාකරණය - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

12.මහජන පැමිණිලි - ගරු මන්ත්‍රී කේ.ටී.වසන්ත කුමාර මහතා

13.පිරිවෙන් හා පූජණීය ස්ථාන - ගරු මන්ත්‍රී ඩබ්.ජයන්ත නිමලසූරිය මහතා

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එච්.ඊ.ඊ.එස්.ප්‍රභාෂණ මහතා

## යෝජනා අංක 19

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

බමුණුගෙදර කොට්ඨාශයේ දාහිගමුව ග්‍රාම නිලධාරී වසමේ ප්‍රධාන මාර්ගයේ සිට කනත්ත දක්වා ඇති අතුරු මාර්ගයේ දැනට සභාව වෙත පවරාගෙන නැති ඉතිරි කොටස ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන ඉදිරි සංවර්ධන කටයුතු කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

## තීරණ අංක 20

බමුණුගෙදර කොට්ඨාශයේ දාහිගමුව ග්‍රාම නිලධාරී වසමේ ප්‍රධාන මාර්ගයේ සිට කනත්ත දක්වා ඇති අතුරු මාර්ගයේ දැනට සභාව වෙත පවරාගෙන නැති ඉතිරි කොටස ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන ඉදිරි සංවර්ධන කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව බමුණුගෙදර කොට්ඨාශයේ දාහිගමුව ග්‍රාම නිලධාරී වසමේ ප්‍රධාන මාර්ගයේ සිට කනත්ත දක්වා ඇති අතුරු මාර්ගයේ දැනට සභාව වෙත පවරාගෙන නැති ඉතිරි කොටස ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන ඉදිරි සංවර්ධන කටයුතු කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

## යෝජනා අංක 20

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

මැහිඇල්ල කොට්ඨාශයේ පිහිටා ඇති දීර්ඝ කාලයක් භාවිතා නොකිරීම නිසා වල්බිහිවී ඇති පොළ භූමිය සංවර්ධනය කර ප්‍රදේශවාසීන්ට ප්‍රතිලාභයක්ද,සභාවට ආදායම් මාර්ගයක්ද වන පරිදි සක්‍රිය කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්.මහේෂ් ගුණතිලක මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.ගරු සභාපතිතුමනි, මේ පොල ගොඩනැගිල්ල මීට වසර 11 කට පෙර තමයි ඉදිකරන්නේ.මේ දක්වාම එහි කිසිම සංවර්ධන කටයුත්තක් සිදු වෙලා නෑ.මේ ගොඩනැගිල්ල දැන් ප්‍රදේශයට ගැටළුවක් බවට පත්වෙලා.නීතිවිරෝධී කටයුතු සිදුවෙනවා මේ පොල

ටෙන්ඩර් කිරිමක් කලා 2022 අවුරුද්දේ රු.145000.00 කට. කිසිවෙකුත් ටෙන්ඩරය ගත්තේ නැහැ.ඒකට හේතුව මේක පොලක් විධිහට සංවර්ධනය වී නොමැති කම.මේ ගොඩනැගිල්ල මේ විධිහටම තිබුනොත් විශාල ගැටළුවක් වෙනවා ප්‍රදේශයට.විශාල ජනසනත්වයක් තිබෙන ප්‍රදේශයක්.මගේ යෝජනාව තමයි මේ පොල සංවර්ධනය කර ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව ලැබෙන තෙක් ඉදිරි මාස 05 තුල වෙළෙන්දන් සහ පාර්භෝගිකයන් හුරු වන තෙක් නොමිලේ හෝ වෙළඳාම් කිරීමට ඉඩදී මේ පොල සක්‍රීය කිරීමට කටයුතු කිරීමයි.

ගරු මන්ත්‍රී ඩී.එම්.එස්.හර්ෂණ මහතා

ගරු සභාපතිතුමනි, මමත් මේ ප්‍රදේශයේ තමයි ජීවත් වෙන්නේ. විශාල මුදලක් වියදම් කරල හදපු මේ පොල ගොඩනැගිල්ල ඉදිකරල තියෙන්නේ ශක්‍යතා අධ්‍යනය කිරීමකින් නෙමේ කියලයි මට හිතෙන්නේ. වසර 11කට පෙර ඉදිකරපු පොල ගොඩනැගිල්ල ගැන කිසිම කිසිදු සොයා බැලීමක් හෝ කිසිදු මැදිහත්වීමක් කරලා නැහැ.මේවෙන කොට පොලභූමිය වල්වැදිලා මේක හදන්න වැයකරපු මිනිස්සුන්ගේ මුදල් වලට වගකියන්න කවුරුත් නෑ.මේ පොල මේ තත්වයෙන් ටෙන්ඩර් කලාට ආදායමක් ගන්න බැරි නිසා මිනිස්සු ගන්නෙ නෑ. පොල සංවර්ධනය කරල ආකර්ශණීය තත්වයකට පත්කලොත් සභාවට ආදායම් උත්පාදනයකට යන්න පුළුවන් වෙයි. එතෙක් වෙළෙන්දන් සහ පාරිභෝගකයින් හුරු කර ගැනීම සඳහා ඉදිරි මාස 04ක කාලය සදහා නොමිලේ හෝ ඉතා සහනදායී මිලකට ලබාදී මේ පොල සක්‍රීය කිරීම සඳහා අනුමැතිය ලබාදියයුතුයි කියලා මම හිතනවා.

ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා

ගරු සභාපතිතුමනි, ගරු මහේෂ් මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව සම්බන්ධව මම එකඟ වෙන්නේ නැහැ මේ පොල අතහැර දාපු එකක් විධිහට සලකනවට.මේ සභාවේදීත් කථා කලා .ඔතනදි තීරණයක් ගන්න බැරිවුනේ භූමිය පිළිබඳ ගැටළුවක් නිසා.එම ප්‍රදේශයට යහපතක් කිරීමේ අරමුණින් තමයි මට මතක විධිහට දැයට කිරුල වැඩසටහනට සමගාමීව මේ පොල ගොඩනැගිල්ල ඉදිවුනේ.ඒ ප්‍රදේශය නියෝජනය කරපු මන්ත්‍රීතුමා බොහොම උත්සාහ කලා ඔයයොදපු මහජන මුදල, සභාවට ආදායම් මාර්ගයක් කිරීමටත් එයින් ප්‍රදේශයේ මහජනතාවට ප්‍රතිලාභ සැලසීමටත්.නමුත් නීතිමය ගැටළු නිසා වෙන්න පුළුවන් ඒ කටයුත්ත සිදු නොවුනේ.නොමිලේ දෙන්න පුළුවන්ද කියලා එහි නීතිමය තත්වය මම දන්නේ නැහැ.රජයේ භූමියක පවතින ගොඩනැගිල්ලක් විදිහට තවදුරටත් විශාල සංවර්ධනයකට යන්නේ නැතිව අත්‍යාවශ්‍ය මූලික පහසුකම් ටික සලසලා එම පොල භූමිය සක්‍රීය කිරීම කඩිනමින් කරනවා නම් හොඳයි කියලා මමත් හිතනවා.

## තීරණ අංක 21

මැහිඇල්ල කොට්ඨාශයේ පිහිටා ඇති දීර්ඝ කාලයක් භාවිතා නොකිරීම නිසා වල්බිහිවී ඇති පොළ භූමිය සංවර්ධනය කර ප්‍රදේශවාසීන්ට ප්‍රතිලාභයක්ද, සභාවට ආදායම් මාර්ගයක්ද වන පරිදි සක්‍රීය කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව මැහිඇල්ල කොට්ඨාශයේ පිහිටා ඇති පොළ භූමියේ සංවර්ධන කටයුතු ඇති කිරීම අරමුණු කරගෙන මෙම

වසරේ ඉදිරි මාස කිහිපය සඳහා කිසිදු ගාස්තුවක් අයනොකර වෙළඳ ප්‍රජාවට සිය වෙළඳ කටයුතු කරගෙන යාමට අවස්ථාව ලබාදීමටත්,සභාවට ආදායම් උත්පාදනය කර ගැනීමට හැකි වන පරිදි වෙළඳ ප්‍රජාව බිහිවන තුරු එළඹෙන වසර තුල සභාවේ මැදිහත් වීම තුල ආදායමක් උපයා ගැනීමට කටයුතු කිරීමත් එම සතිපොල 2027 වසරේ සිට ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ බදු ලබාදීමත් සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්.මහේෂ් ගුණතිලක මහතා

## යෝජනා අංක 21

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

වත්තේ ගෙදර කොට්ඨාශයේ කෝරලේ ගෙදර ග්‍රාම නිලධාරී වසමට අයත් තිරගම පත්තිනි දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යය 2025.08.22 දින පැවැත්වීමට නියමිත බැවින් ඊට පෙර ඉතාමත් අබලන් තත්වයක පවතින තිරගම දේවාල පාර සංවර්ධන කිරිමට කටයුතු කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිරකුමාර මහතා

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මම ස්ථිර කරනවා. ඇත්තටම මේක හදිසි යෝජනාවක් තමයි.සෑම වසරකම සභාවක් ලෙස පත්තිනි දේවාලේ පෙරහැරට සම්බන්ධ වෙනවා.අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙනවා.එම මාර්ගය බොහොම දුෂ්කර පාරක්. හැකි උපරිම දායකත්වයක් ලබාදීල එම පෙරහැර ගමන් කරන කිලෝමීටර් දෙකක පමණ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

## තීරණ අංක 22

වත්තේ ගෙදර කොට්ඨාශයේ කෝරලේ ගෙදර ග්‍රාම නිලධාරී වසමට අයත් තිරගම පත්තිනි දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යය 2025.08.22 දින පැවැත්වීමට නියමිත බැවින් ඊට පෙර ඉතාමත් අබලන් තත්වයක පවතින තිරගම දේවාල පාර සංවර්ධන කිරිමට කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ඉතාමත් අබලන් තත්වයක පවතින තිරගම දේවාල පාර 2025.08.22 දිනට පෙර සංවර්ධන කිරිමට කටයුතු කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිරකුමාර මහතා

<u>යෝජනා අංක 22</u>

2025.07.24 දින පැවැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ තීරණ අංක 12 පරිදි කුරුණෑගල ප්රාදේශීය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 25 නියේජනය කරමින් ක්‍රීඩා කණ්ඩායම් 25 ක් අතර අන්තර් කොට්ඨාශ සුහද වොලිබෝල් තරඟාවලියක් පැවැත්වීම සඳහා සහ ලබාදී ඇති රු.1,880,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි,කොට්ඨාශ මට්ටමින් කොහොමද හොඳ කණ්ඩායමක් තෝරා ගන්නේ.මගේ කොට්ඨාශය තුල තියෙන විල්බාවෙත්,හේනෙමුල්ලේත් හොඳ වොලිබෝල් කණ්ඩායම් දෙකක් තියෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වසම් මට්ටමින් ගත්තොත් වසම් 120ක් තියෙනවා. එතකොට කණ්ඩායම් 120ක් සඳහා විශාල කාලයක් ගත කරන්න වෙනවා. ඒකයි කොට්ඨාශ මට්ටමින් කණ්ඩායම් 25 ක් අතර තරඟාවලිය පැවැත්වීම සුදුසුයි කියලා යෝජනා කරන්නේ.කොහොම වුනත් මේ මූලික අදහසක් පමණයි. මේ සම්බන්ධව නිශ්චිතවම සැලසුමක් සකස් කරලා මහසභාවේ අනුමැතියට යොමු කිරීමට බලාපොරොත්තු වෙනවා.මේ යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යැවිය යුතු නිසයි මේ සභාවට යොමු කලේ. දැනට සැලැස්ම, වසම් 25කින් කණ්ඩායම් 25 ක් තෝරාගන්නත්,ක්‍රීඩා සමාජ දැනට සෑහෙන ප්‍රමාණයක් අක්‍රීය තත්වයේ තියෙන්නේ.වසම් මට්ටමින් තියෙන යෞවන සමාජ වලට රු.10,000.00 ක උපරිමයකට යටත්ව අවශ්‍යතාවය පරිදි ක්‍රීඩා භාණ්ඩ සෑම වසමකටම ලබාදීමට තමයි ඉදිරි වැඩ සැලැස්ම සකස් වෙන්නේ.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා</u>

ගරු සභාපතිතුමනි,ක්‍රීඩා සමාජ ගත්තොත් ප්‍රාදේශීය ලේකම් කෙට්ඨාශ, ග්‍රාම නිලධාරී කොට්ඨාශවල ක්‍රීඩා සමාජ තියෙනවා.යෞවන සමාජත් එහෙමයි .ක්‍රීඩා සමාජ සහ අන්තර් ක්‍රීඩා සමාජ තියෙනවා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්,දිස්ත්‍රික් මට්ටමින්,පලාත් මට්ටමින් ක්‍රියාත්මක වන. යෞවන සමාජත් එහෙමයි.මේ යෝජනාව අපි දකින්නේ හදිසි යෝජනා යටතේ ගෙනත් අයවැය ලේඛණයේ නැති මුදලක් ලබන අයවැයෙන් උදුරා ගැනීම සඳහා ගන්නා දේශපාලන ව්‍යාපෘතියක් ලෙස.මේකෙන් යෞවන සමාජ ව්‍යාපාරය සම්පූර්ණයෙන් විනාශ වෙනවා. ගම්බඳව හොරෙන් පිහිටවපු ක්‍රීඩා සමාජ තියෙනවා. ................(පැහැදිලි නැත)යෞවන සමාජ වල හිටපු නිලධාරීන් විධිහට අපි දන්නවා ව්‍යවස්ථා,නිලධාරීන් පත් කිරීම් ආදී ක්‍රමවේදයන්ගෙන් තොරව පිහිටුවාගෙන ඇති කණ්ඩායම් වල තරුණයින්ට අපේ මහජන මුදලින් නීත්‍යානුකූල නොවන විධිහට ලක්ෂ 18 ක් බෙදාහැරීමේ ව්‍යාපෘතියක් තමයි මේ

ක්‍රියාත්මක වන්නේ.එහෙම නැතිනම් තමුන්නාන්සේ මේ බලප්‍රදේශයේ තරුණයින්ගේ හැකියාවන් දියුණු කරන්න කැමතිනම් දැනට පවතින නීත්‍යානුකූල ක්‍රීඩා සමාජ වල වොලිබෝල් කණ්ඩායම් 25 ක් ක්‍රීඩා නිලධාරීන්ගේ සහ තරුණසේවා නිලධාරීන්ගේ අධීක්ෂණයෙන් ක්‍රමවත් ක්‍රමවේදයකට අනුව තෝරාගෙන එම ක්‍රීඩා භාණ්ඩ බෙදාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.එහෙම කරනවා නම් මේ යෝජනාවට අපේ එකඟතාවය පල කරනවා. එහෙම නැතිව හැංගි හැංගි වොලිබෝල් 10 ක්, බැට් එකක් බෙදන්න ලැස්ති වෙනවා නම් කරුණාකරල ඒක කරන්න එපා. තමුන්නාන්සේලා ආවේ සිස්ටම් චේන්ජ් කරන්නනේ.එහෙම කලොත් ජොන්ස්ටන් ඇමතිතමන්ලාගෙන් ඔබතුමාලා වෙනස් වෙන්නෙ නැනෙ.

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.එස්.හර්ෂණ මහතා</u>

ගරු සභාපතිතුමනි, අජිත් ප්‍රියලාල් මන්ත්‍රීතුමා කියනවා යෞවන සමාජ හොරෙන් පිහිටුවලා කියලා.වගකීමෙන් කියන්නේ මමත් හිටපු යෞවන සමාජ ක්‍රියාකාරිකයෙක් විධිහට හොරෙන් පිහිටවපු යෞවන සමාජ කොහේවත් නෑ.යෞවන කටයුතු අමාත්‍යාංශයේ අලුත් සංකල්පයක් ඇවිල්ලා තියෙනවා යූත් ක්ලබ් කියලා.නම වෙනස් වෙලා.සමාජෙ වෙනස් වෙනවා,රට වෙනස් වෙනවා,නව සංකල්ප වලට යන්න ඕනෑ. අන්න ඒ විධිහට තමයි මේ නම වෙනස් වෙන්නේ.හැබැයි මේ යූත්ක්ලබ් වලට තරුණ තරුණයෝ බඳවාගෙන තියෙන්නේ තරුණසේවාසභා වල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඒ නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් හා මගපෙන්වීමෙන්මයි. කිසිම තැනක තරුණයෝ බලහත්කාරයෙන් බඳවාගෙන නෑ. තරුණ තරුණයෝ එකතු වෙනවා,අදහස් යෝජනා සම්මත කර ගන්නවා.ඔබතුමා කියනවා නම් මේ යූත්ක්ලබ් කිසියම් දේශපාලන උපක්‍රමයක් වශයෙන් පාවිච්චි තියෙන්නේ කියලා මම ඒකට එකඟ වෙන්නේ නැහැ. මේ යෞවන සමාජවලින් වැඩ වෙලා තිබුනා ඉස්සර.නමුත් කාලයක් ඒක අක්‍රීය වෙලා තිබුනා . නමුත් දැන් යෞවන කටයුතු අමාත්‍යාංශයට උවමනාව තියෙන බව පේනවා නැවත ගමේ ඉන්න තරුණයින්ව ශක්තිමත් කරල ඔවුන්ට සැබෑ ලෙසම ප්‍රතිලාභ යන විධිහට වැඩකටයුතු කරන්න.ඒ නිසා ඔබතුමා කියන පරිදි යූත් ක්ලබ් අනීතිකව ඇති වෙලා කියන ප්‍රකාශය මම තරයේ ප්‍රතික්ෂේප කරනවා.

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා</u>

මමත් 1997 දී යෞවන සමාජ ක්‍රියාකාරිකයෙකු විධිහට ඇවිල්ලා තමයි මේ දේශපාලනයට ආවේ.ඒ ඒ වකවානුවේ දේශපාලන අභිමතය පරිදි තමයි යෞවන සමාජ ආරම්භ කලේ,ක්‍රියාත්මක වුනේ.ඇත්තටම පහුගිය කාලයේ ගම්වල යෞවන සමාජ සක්‍රීය තත්වයේ තිබුනේ නැහැ. මේ ආණ්ඩුව ආවට පස්සේ මේක දේශපාලනීකරණය වුනේ නෑ.හැබැයි අක්‍රීය වෙලා තිබුන යෞවන සමාජ අපි සක්‍රීය කරගත්තා රාජ්‍ය නිලධාරීන්වත් සම්බන්ධ කරගනිමින්.පක්ෂ බේදයකින් තොරව අපි ආරාධනා කරලා තියෙනවා.ගරු සභාපතිතුමනි මම යෝජනා කරනවා අපි මේ කටයුත්ත සිදුකිරීමේදී කමිටුවක් පත්කරගනිමු.ඒ කමිටුව හරහා හොඳ වැඩසටහනක් නිර්මාණය කරගනිමු.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.යූ.ප්‍රේම් කියාස් මහතා</u>

ගරු සභාපතිතුමනි,ඉන්දික මන්ත්‍රීතුමා කිව්වා මේ යූත් ක්ලබ් අක්‍රීය වෙලා තිබුනා කියලා.සමහර තැන් වල අක්‍රිය වෙලා තියෙන්න ඇති නමුත් හදිරවලාන යූත්ක්ලබ් එක හොඳට සක්‍රීයව තිබෙනවා.මගේ පුතා තමයි කුරුණෑගල

කොට්ඨාශයේ යූත් මන්ත්‍රීවරයා.එතුමා සෑහෙන වැඩකොටසක් කරලා තියෙනවා මේ ගම්වලට.වැව්වල ඇලවේලි කපලා ,කානුපද්ධති හදල දිල තියෙනවා.ඒ වගේ සෑහෙන වැඩකොටසක් යූත් එකෙන් කරලා තියෙනවා.ඒ නිසා අජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ ඔබතුමාලා විනිවිධභාවයෙන් යුක්තව වැඩකරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

ගරු සභාපතිතුමනි,මමත් මගේ කොට්ඨාශයේ තරුණ සමාජයක් පිහිටෙව්වා.වගකීමෙන් කියන්නේ කිසිම දේශපාලන බලපෑමක් කලේ නෑ.මගේ එක්ක හිටපු මන්ත්‍රීවරු සාක්ෂි දරයි.අපි ආරාධනා කලේ පොදුවේ.පැවතුන දේශපාලන ක්‍රමයේ බලපෑම නිසාම ගමේ මොකක් හරි වැඩක් සංවිධානය කරනකොට තාමත් අර බෙදීම තියෙනවා.මම හැමවෙලාවේම කිව්වේ මේක දේශපාලනයක් නොවේ හුදෙක් ගමේ ඔයාලගෙ වැඩසටහනක් බව.නමුත් ගෙවල් මට්ටමින් ගිහින් කථා කලත් වෙනත් දේශපාලන පක්ෂ වල අය මේවට සම්බන්ධ වෙන්න අකමැතියි.කිසිම දේශපාලන බලපෑමක් කලේ නැහැ.ඒ සඳහා පැමිණි අය ස්වේච්ඡාවෙන්මයි ඔවුන් ඉදිරිපත් වුනේ.නිලතල වලට පත්වුනේ.ඉදිරියේදීවත් අපි බලාපොරොත්තු වෙනවා පක්ෂ බේදයකින් තොරව මේ කටයුතු සඳහා සහයෝගය ලබාදෙයි කියලා.

ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා

ගරු සභාපතිතුමනි,නුවර යන්න ගිහින් කොළඹ බස් එකට නැංගා වගේ දෙයක් වෙලා තියෙන්නේ.තුෂාර මන්ත්‍රීතුමා කිව්ව එක දෙයක් ගැන ගැටළුවක් තියනවා.යෞවන සමාජ අක්‍රීය වුනාද නැද්ද කියලා අපේ සුමුදු මන්ත්‍රීතුමා දන්නවා.එතුමා හොද යෞවන සමාජ සාමාජිකයෙක්.කුරුණෑගල ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා මේ තරඟාවලී පැවැත්වීම අද ඊයෙ ආරම්භ වුන දෙයක් නෙමේ. 2002 මම මේ සභාවට සම්බන්ධ වුන කාලයේ පටන් අපි වොලිබෝල්, ක්‍රිකට් තරඟාවලියක් සංවිධානය කලා.කොට්ඨාශ මන්ත්‍රීවරුන් මගින් හෝ පොඩි සමීක්ෂණයක් කලොත් දැනගන්න පුළුවන් වෙයි,මේ කුරුණෑගල බලප්‍රදේශයේම වොලිබෝල් කණ්ඩායම් උපරිමව 25 ත් 30 ත් අතර ප්‍රමාණයක් තියෙයි.මොකද වොලිබෝල් සෙල්ලම් කරනවා නම් ක්‍රීඩාපිටියක් දැලක් හයි කරපු, බෝලයක් තියෙන්න ඕනැ. හඳුනා ගන්න අමාරුවෙන්නෙ නැහැ.එහෙම කටයුතු කලොත් ඔය කිසිම ගැටළුවක් එන්නෙ නැති වෙයි කියල මම හිතනවා.

ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිරකුමාර මහතා

ගරු සභාපතිතුමනි, 2018 සභාව පිහිටපු වෙලාවේ මට මතකයි, සභාගත කරන යෝජනාව හොඳ වුනත් නැතත් ඒ පක්ෂයේ අය ඒ මතයේම හිටියේ.යෝජනාවක් ගේනකොට අපි ඉන්න ඕනැ පක්ෂයේ මතයේ නෙමෙයි,මේ යෝජනාව හොඳද,නරකද,මිනිස්සුන්ට මේකෙන් යහපතක් වෙනවද නැද්ද,මේ යෝජනාව මහ පොලවේ ක්‍රියාත්මක කරන්න පුළුවන්ද බැරිද කියන තමයි මේ සභාවේ අය ඉන්න ඕනැ.මමත් මේ සභාව මගින් පවත්වපු තරඟාවලී වලදී වොලිබෝල් කණ්ඩායම් නියෝජනය කලා.වොලිබෝල් තරඟ,ක්‍රිකට් තරග පවත්වලා තෑගි ප්‍රදානය කලා.හැබැයි සභාපතිතුමා ඔය සමිති පිහිටවපු තැන් වල බහුතරය සම්බන්ධ වුනේ නෑ. බහුතරයක් නැති තැන් තිබුනා.තියෙන්නේ කොට්ඨාශ 25 යි. කොට්ඨාශයක වසම් 05 ක් තියෙනවා නම් ඒ පහේ කණ්ඩායම් පහක් තියෙනවා නම් සභාවේ

මන්ත්‍රීවරුන් 42 අතරින්කොට්ඨාශය තුල සිටින මන්ත්‍රීවරුන් යොදවලා ඒ අතර තරඟයක් තියලා කණ්ඩායමක් තෝරගන්න.කණ්ඩායමකට සෙල්ලම් කරපු අපටත් පුළුවන් ඒ සයෝගය දෙන්න.එතකොට අවසානෙට ඉතිරි වෙන්නේ කණ්ඩායම් 25 යි.ඒ කණ්ඩායම් 25ට අපි තෑගි ටික දෙමු.ඔවුන්ව ප්‍රවර්ධනය කරමු. එහෙම නැතිව ග්‍රාම නිලධාරී වසමක් වසමක් ගානේ ගිහිල්ලා එහෙම බෙදීම අසාර්ථකයි කියලයි මට හිතෙන්නේ.මේ වොලිබෝල් තරඟාවලියක් පැවැත්වීමේ යෝජනාව හොඳයි.එම යෝජනාව ගෙනඒම පිළිබඳව මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා.හැබැයි එම යෝජනාව ක්‍රියාත්මක කරන කොට සද්භාවයෙන් කටයුතු කරන්න.

<u>ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිරකුමාර මහතා කථා කලා.ඇත්තටම අපි දේශපාලනික වශයෙන් ප්‍රබල වුනේ ගම්වලට ගිහිල්ලා මොනවත් බෙදලා නෙමේ. ඒක පළමුවන කාරණය.වොලිබෝලයක් නෙට් එකක් බෙදලා දේශපාලනික අරමුණු ඉටුකරගන්න බෑ.කොට්ඨාශයක් ගත්තම ග්‍රාම නිලධාරී වසම් හතක් අටක් තියෙන්න පුළුවන්.මේ කොට්ඨාශයක තරුණ තරුණයෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා.ඉතින් කොට්ඨාශයකට වොලි බෝලයක්,නෙට් එකක් දුන්නම මේ ප්‍රජාව එකතු වෙලා සෙල්ලම් කරයිද? අපිට ඕනෑ මේ තරුණ කණ්ඩායම් දූෂණ වලින්,අපචාර වලින් ගලවා ගන්න ක්‍රීඩාවකට යොමු කරලා.වසමකට වොලි බෝලයක් නෙට් එකක් දුන්නොත් පොල් ගස් දෙකක හරි ගැට ගහල සෙල්ලම් කරන තැනට මේ අය පත් කරන්න ඕනෑ.විශේෂයෙන්ම මම කියන්නේ අපි මේක කරන්නේ දේශපාලනික අරමුණකින් නෙවෙයි. මේ පරපුර ක්‍රීඩාවකට නැඹුරු කරලා සමාජ විෂමතාවයෙන් බේරා ගන්න.ඒ නිසා සෑම වසමකින්ම කණ්ඩායමක් තරගයට යොමු කරලා ත්‍යාග පිරිනැමීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ඩී.එම.තරංගා දිසානායක මිය</u>

ගරු සභාපතිතුමනි,මෙහෙම තරඟාවලියක් පවත්වන එක හොඳයි.මේ තරගාවලියෙන් තෝරාගන්නා වොලිබෝල් කණ්ඩායම අපේ ඉදිරි පලාත්පාලන වොලිබෝල් තරඟාවලී සඳහා ඉදිරිපත් කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා</u>

ගරු සභාපතිතුමනි,මම තමයි මේ යෝජනාව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට ගෙනාවේ. කිසිම දේශපාලනික අරමුණකින් ඉදිරිපත් කල යෝජනාවක් නෙමෙයි.මොකද අපේ අනාගත පරපුර ෆෝන් එකෙන්,මත්ද්‍රව්‍ය වලින් දුම්වැටියෙන් බේරා ගැනීමේ අරමුනින් ,හැම ගමකම ක්‍රීඩාව වැඩිදියුණු කලයුතුයි කියන පරම පවිත්‍ර චේතනාවෙන් තමයි මේ යෝජනාව ගෙනාවේ.එම යෝජනාව වැඩිදියුණු කරමින් තමයි ක්‍රීඩා තරගයක් වශයෙන් අඛණ්ඩව හැම වර්ෂයකම පැවැත්වීම තුලින් ගල්උඩ බෝක්කු උඩ නිකරුනේ විනාශ වන තරුණ පරපුර බේරා ගන්න සෑම ගමකටම වොලි බෝලයක්,නෙට් එකක් ලබාදීල ඔවුන් ක්‍රීඩා කරන්න යොමු කරන්න,ධෛර්යමත් කරන්න කරන උත්සාහයක් මේ.

ගරු මන්ත්‍රී බී.එම්.කුමාරදාස මහතා

ගරු සභාපතිතුමනි,බොහොම හොද යෝජනාවක් මේ ඉදිරිපත් කරලා තියෙන්නේ.මීට කලින් ප්‍රාදේශීය සභාවේ කොට්ඨාශ කිහිපයක ක්‍රීඩා පිටි වල වොලි බෝල් කෝට් හදලා තියෙනවා. නමුත් ඒවා මග නතර වෙලා තියෙනවා.මම සූරියවත්තේ හැදුවා.ඒක සම්පූර්ණ කලා.රත්කරව්වේ ,අලකොලදෙනියේ හැදුවා සමහර ක්‍රීඩා පිටි සභාව මැදිහත්වෙලා.අන්න ඒ ක්‍රීඩා පිටි ගැනත් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.සමස්ථයක් වශයෙන් ගත්තම මේ මොහොතේදීම අපිට තිරණයකට එන්න බෑ. හරියටම මුදල නිශ්චය කරලා සභාවේ මන්ත්‍රිවරුන් 42 ම සම්බන්ධ වෙලා සාකච්ජා කරලා සභාවේ ගෞරවය රැකෙන පරිදි හොඳ තරඟාවලියක් පවත්වමු කියලා ඉල්ලා සිටිනවා සියළු දෙනාගේ එකගතාවය මත.

ගරු මන්ත්‍රී කේ.පද්මචන්ද්‍ර මහතා

ගරු සභාපතිතුමනි ක්‍රීඩාව වොලිබෝල්.සභාවෙත් පොඩි කළබලයක් තියෙනවා මේ සම්බන්ධව.හැබැයි වොලිබෝල් ක්‍රීඩාව කරන්නත් බෑ කඩිසරකම,කලබලය නැතිව.දිවාරාත්‍රී ක්‍රීඩාකල හැකි ක්‍රීඩාපිටි කිහිපයක් තියෙනවා අද කිසිම ප්‍රයෝජනයක ගන්නේ නැතිව වල් බිහිවෙලා.හැබැයි කොහෙන් දුන්නත් මහජන මුදල් තමයි දිලතියෙන්නේ.ක්‍රීඩා සමිති සහ යෞවන සමිති වෙන්කර ගැනීම පිළිබඳ ගැටළුවක් ඇති බව මට දැනුනා.ක්‍රීඩා සමිති වලට උපකරණ දෙනවා නම් නීත්‍යානුකූලව ලියාපදිංචි ක්‍රීඩා සමිති වෙන්න ඕනෑ.අපේ ගම් ප්‍රදේශයේත් තියෙනවා ක්‍රීඩා පිටි කිහිපයක් වල් බිහිවුන. මේවා දුන්න කියලා මම හිතන්නේ නෑ 100% ක්‍රීඩාවට පිරිස යොමු වෙයි කියලා.අපි දෙන්නේ කාටද,උපකරණ කට්ටලය තියෙන්නේ ගෙවල් ඇතුලෙද , පසුවිපරමක් වෙනවාද, ප්‍රතිපලය අපි ගන්නේ කොහොමද කියලා සාකච්ජාවට අරගෙන ක්‍රියාත්මක කලයුතු කාරණයක් විධිහට මම දකිනවා.

ගරු සභාපතිතුමා

මේ කාරණාවේදී සවිස්තරාත්මක වැඩසැලසුමක් ඉදිරි මහසභාවක් වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.දැනට මේ මූලික සැලැස්ම සකස් කලේ ගරු ආණ්ඩුකාර අනුමැතියට ලබාගැනීමේ කාලය සලකලයි . මුදල් වැයවන ආකාරය ආදිය ඇතුලත් ඉදිරියේදී සම්පූර්ණ වැඩසටහනක් විධිහට සකස් කරල මහසභාවේ දැනුවත් වීම සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

## තීරණ අංක 23

2025.07.24 දින පැවැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ තීරණ අංක 12 පරිදි කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 25 නියෝජනය කරමින් ක්‍රීඩා කණ්ඩායම් 25 ක් අතර අන්තර් කොට්ඨාශ සුහද වොලිබෝල් තරඟාවලියක් පැවැත්වීම සඳහා ගෙන ඇති යෝජනාව සම්බන්ධයෙන් ගරු මහසභාව වෙත ලබාදී ඇති රු.1790,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව 2025.07.24 දින පැවැති නිවාස හා

ප්‍රජා සංවර්ධන කමිටුවේ තීරණ අංක 12 පරිදි කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 25 නියෝජනය කරමින් ක්‍රීඩා කණ්ඩායම් 25 ක් අතර අන්තර් කොට්ඨාශ සුහද වොලිබෝල් තරඟාවලියක් පැවැත්වීම සඳහා සහ පහතින් දක්වා ඇති රු.1790,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් බහුතර කැමැත්තෙන් තීරණය කරණ ලදී.

<u>සභාව මඟින් කොට්ඨාශ 25 ඇතුළත්ව පවත්වනු ලබන වොලිබෝල් තරඟාවලියට අදාළ වියදම් ඇස්තමේන්තුව</u>

| අනු අංකය | විස්තරය | ඒකකයක මිල | වට්නාකම | එකතුව |
|---|---|---|---|---|
| 01 | වොලිබෝලයක් හා දැලක් ලබා දීම ( ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් ) | 10,000.00 | 111 | 1,110,000.00 |
| 02 | දිවා ආහාරය සඳහා ( 25×12) | 500.00 | 300 | 150,000.00 |
| 03 | විනිශ්චය මණ්ඩලය , විශේෂ ආරාධිත අමුත්තන් හා නිළධාරීන් සඳහා | 500.00 | 200 | 100,000.00 |
| 04 | 1 වන ස්ථානය ශූරතා කුසලානය, මූල්‍ය ත්‍යාග හා සහතික | | | 75,000.00 |
| 05 | 2 වන ස්ථානය අනුශූරතා කුසලානය , මූල්‍ය ත්‍යාග හා සහතික | | | 50,000.00 |
| 06 | උදය සහ සවස් කාලය සඳහා සංග්‍රහ | | | 50,000.00 |
| 07 | ශබ්ද විකාශනය සඳහා | | | 25,000.00 |
| 08 | වොලිබෝල් ක්‍රීඩා පිටිය සකස් කිරීම හා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම | | | 50,000.00 |
| 09 | විනිශ්චය මණ්ඩල දීමනාව | 7000.00 | 10 | 70,000.00 |
| 10 | නිවේදන කටයුතු සඳහා ( දෙදෙනෙකු ) | | | 10,000.00 |
| 11 | ආරාධිත අමුත්තන් සඳහා සංග්‍රහ (උදේ/සවස) | | | 25,000.00 |
| 12 | වොලිබෝල් තරඟාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා | | | 20,000.00 |
| 13 | පිටිකව හා | | | 35,000.00 |
| 14 | වෙනත් වැය දැරීම් | | | 20,000.00 |
| | | | එකතුව | 1790,000.00 |

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## යෝජනා අංක 23

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

2025.08.15 දින වත්තේගෙදර කොට්ඨාශයේ ජංගම සේවයට සමගාමීව පහතින් සදහන් මාර්ග කිහිපයක් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයෙන් සහ **JCB** යන්ත්‍රය යොදාගෙන සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

මෝටර් ග්‍රේඩර් කිරීම

**01.** කටුපිටිය දකුණු ඇලිවල තැන්න මාර්ගය
**02.** කටුපිටිය දකුණු ඇලිවල තැන්න අතුරු මාර්ගය
**03.** බෝගමුව වෙලමැද බෝගහ මාර්ගය
**04.** මහගම ඊරියගහමඩ මාර්ගය
**05.** උඩුපිටිය වෙලමැද මාර්ගය -ගනාරඹ සිට
**06.** ඉහල තලම්පිටිය මාර්ගයේ මලගනේ වෙලමැද මාර්ගය
**07.** ස්ටේෂන් වත්ත මාර්ගය -තිරගම
**08.** නැලව බෝගමුව මාර්ගය

**JCB** යන්ත්‍රය යෙදවීම

**01.** ඉහල තලම්පිටිය වසමේ බුළුගොල්ල මාර්ගය දෙපස කැලය කැපීම
**02.** ගල්කඩේ කුදුම්බුව මාර්ගයේ 03 වන අතුරු මාර්ගය

ගරු මන්ත්‍රී ඊ සංජය ඇතුගල මහතා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිරකුමාර මහතා

ගරු සභාපතිතුමනි,මේ වෙනකොට සභාවේ විවිධ වැඩසටහන් යනවා.අපි පක්ෂ පාට භේදයකින් තොරව මේ වැඩසටහන් සඳහා උදව්කරනවා.පළවෙනි මහසභාවේදීත් අපි මේ ගැන කිව්වා.අපි සියළුම දෙනා මේ සභාවේ මන්ත්‍රීවරුන්. ඒ නිසා සභා අරමුදලින් යම් ව්‍යාපෘතියක් කරන කොට ඒ අදාල කොට්ඨාශයේ මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

## තීරණ අංක 24

2025.08.15 දින වත්තේගෙදර කොට්ඨාශයේ ජංගම සේවයට සමගාමීව මාර්ග කිහිපයක් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයෙන් සහ **JCB** යන්ත්‍රය යොදාගෙන සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින්

ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව 2025.08.15 දින වත්තේගෙදර කොට්ඨාශයේ ජංගම සේවයට සමගාමීව පහතින් දැක්වෙන මාර්ග මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයෙන් සහ JCB යන්ත්‍රය යොදාගෙන සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

මෝටර් ග්‍රේඩර් කිරීම

09. කටුපිටිය දකුණු ඇලිවල තැන්න මාර්ගය
10. කටුපිටිය දකුණු ඇලිවල තැන්න අතුරු මාර්ගය
11. බෝගමුව වෙලමැද බෝගහ මාර්ගය
12. මහගම ඊරියගහමඩ මාර්ගය
13. උඩුපිටිය වෙලමැද මාර්ගය -ගනාරඹ සිට
14. ඉහල තලම්පිටිය මාර්ගයේ මලගනේ වෙලමැද මාර්ගය
15. ස්ටේෂන් වත්ත මාර්ගය -තිරගම
16. නැලව බෝගමුව මාර්ගය

JCB යන්ත්‍රය යෙදවීම

03. ඉහල තලම්පිටිය වසමේ බුළුගොල්ල මාර්ගය දෙපස කැලය කැපීම
04. ගල්කඩේ කුදුම්බුව මාර්ගයේ 03 වන අතුරු මාර්ගය

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඊ සංජය ඇතුගල මහතා

## යෝජනා අංක 24

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

කුඩාගල්ගමුව කොට්ඨාශයේ කුඩාගල්ගමුව වසමේ අලවත්ත ග්‍රාමයේ පිහිටි විශාල බෝක්කුව හරි මැදින් කැඩී මාර්ගයේ මැද අනතුරුදායක වලක් සෑදී ඇති බැවින් කඩිනමින් මෙම බෝක්කුව පිළිසකර කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එච්.එම්.මහින්ද ජයලත් මහතා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මන්ත්‍රී කේ.පද්මචන්ද්‍ර මහතා

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධවයි. මම මගේ වාහනයෙන් අඩි 8 ක් දිග කවය අඩි 03 ක් වන හියුම් පයිප්පයක් බොහොම අමාරුවෙන් එතනට ගෙනෙහින් දැම්මා,දැනට අවුරුදු තුනකට පමණ කලින්. මිනිස් ශ්‍රමයෙන් ඒ වැඩේ කරන්න බැරි නිසා සභාවෙන් එකපාරක් ඉල්ලුවා ජේ.සී.බී.යන්ත්‍රය. දුන්නේ නැහැ.තාමත් බෝක්කුකැටය එතන තියෙනවා.තවත් කාරණයක් ඒ ස්ථානයට යාබද ඉඩම වෙන්දේසි කලා. වෙන්දේසිකරු ඒ පාරෙන් තමයි සියළුම බඩු ඇද්දේ.ඒකෙන් ඒ බෝක්කුව අබලන් වුනා.එතනින් විශාල වතුර පාරක් ගලාබහිනවා. ඒ නිසා එතුමා ගෙනා යෝජනාව ඉතාමත් කඩිනමින් ඉටුකලයුතු යෝජනාවක් ලෙස මම අදහස් කරනවා.එතුමාට ස්තූතිවන්ත වෙනවා එම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන්.

ගරු මන්ත්‍රී එස්.එම්.සී.ජේ.බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි,එම බෝක්කුව සඳහා වන ඇස්තමේන්තුව තාක්ෂණ නිලධාරීන් විසින් අද දින මට ලබාදුන්නා. ඒ සඳහා රු.312000.00 ක් වූ එම ඇස්තමේන්තුව ගරු මහසභාවට ඉදිරිපත් කරනවා..

## තීරණ අංක 25

කුඩාගල්ගමුව කොට්ඨාශයේ කුඩාගල්ගමුව වසමේ අලවත්ත ග්‍රාමයේ පිහිටි විශාල බෝක්කුව හරි මැදින් කැඩී මාර්ගයේ මැද අනතුරුදායක වලක් සෑදී ඇති බැවින් කඩිනමින් මෙම බෝක්කුව පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුඩාගල්ගමුව කොට්ඨාශයේ කුඩාගල්ගමුව වසමේ අලවත්ත ග්‍රාමයේ පිහිටි විශාල බෝක්කුව හරි මැදින් කැඩී මාර්ගයේ මැද අනතුරුදායක වලක් සෑදී ඇති බැවින් කඩිනමින් මෙම බෝක්කුව පිළිසකර කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එච්.එම්.මහින්ද ජයලත් මහතා

තේ පානය සඳහා පෙ.ව.11.55 ට සභාව කල් තබන ලදී.

ප.ව.12.30 ට සභාවේ කටයුතු නැවත ආරම්භ කරන ලදී.

ගරු සභාපතිතුමා

සියළුම දෙනාට සුභ මධ්‍යාහ්නයක් ප්‍රාර්ථනා කරනවා.එහිදී න්‍යාය පත්‍රයට අනුකූලව මහසභාව පවත්වාගෙන යමු.

## යෝජනා අංක 25

ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

මිල්ලව මානෙල් වත්ත ශිරන්ත මහතාගේ නිවසේ සිට පුංචි බණ්ඩා මහතාගේ නිවස දක්වා වූ මාර්ගය සහ අඩුක්කන සමිතිශාලාව අසලින් ඇති ගමමැද පාර  ප්‍රාදේශීය සභා මාර්ග වශයෙන් ලියාපදිංචි කිරීම  සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු  මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක 26

මිල්ලව මානෙල් වත්ත ශිරන්ත මහතාගේ නිවසේ සිට පුංචි බණ්ඩා මහතාගේ නිවස දක්වා වූ මාර්ගය සහ අඩුක්කන සමිතිශාලාව අසලින් ඇති ගමමැද පාර  ප්‍රාදේශීය සභා මාර්ග වශයෙන් ලියාපදිංචි කිරීම  සුදුසු බවට ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව  ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව මිල්ලව මානෙල් වත්ත ශිරන්ත මහතාගේ නිවසේ සිට පුංචි බණ්ඩා මහතාගේ නිවස දක්වා වූ මාර්ගය සහ අඩුක්කන සමිතිශාලාව අසලින් ඇති ගමමැද පාර ප්‍රාදේශීය සභා මාර්ග වශයෙන් ලියාපදිංචි කිරීම  සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු  මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

## කාරක සභා වල වාර්තා සභාගත කිරීම

**01.** 2025.07.29 දිනැති සහ 2027.08.04 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තා සභාගත කරන ලදි.

ගරු සභාපතිතුමා

2025. 07.29 දිනැති සහ 2027. 08.04 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තා පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

සංශෝධනයට යටත්ව  2025.0**7.29** දිනැති සහ 2027.0**8.04** දිනැති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තා පිළිගැනීම සුදුසු බවට ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රීවරුන් වන ඩී.එස්.පුෂ්පලාල් රාජනන්දන මහතා, ගරු මන්ත්‍රී සංජය ඇතුගල මහතා, ගරු මන්ත්‍රී කේ.ජ්.පද්මචන්ද්‍ර මහතා, ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා, ඩී.පී.ජ්.ප්‍රියංකර ගුණතිලක මහතා, එච්.එම්.මහින්ද ජයලත් මහතා සහ ගරු මන්ත්‍රී එම්.ජ්.අයි.තුෂාර චන්ද්‍රසේන</u> මහතා යන මහත්වරුන්ගේ අදහස් <u>ප්‍රකාශය</u>

2025.08.04 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාවේ බොරළු කැපීම හා ප්‍රවාහනය සම්බන්ධ තීරණ අංක 04 හැර තීරණ අංක 03, 05, 06, 08 සම්බන්ධව ඇති වී තිබෙන ගැටළු වලට විසඳුම් සෙවීම සඳහා පත්කල අනුකමිටුව විසින් 2025.08.11 දින රැස්වී සාකච්ජා කර, ගන්නා ලද තීරණ අනුව උක්ත තීරණ අංක සංශෝධනය කිරීමට යටත්ව 2025.08.04 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසුයි

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා</u>

වාර්තා දෙකේ වෙනස් නම් භාවිතා කරලා තියෙනවා.පනත අනුව සෑම තැනම මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වශයෙන් සඳහන් කිරීම සුදුසුයි.

## <u>තීරණ අංක 27</u>

2025. 07.29 දිනැති සහ 2027. 08.04 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තා සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් සංශෝධනයට යටත්ව එම වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

<u>2025.08.04 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාවේ සංශෝධිත තීරණ අංක 03,</u>

මේ සම්බන්ධයෙන් පත්කල අනුකමිටුව විසින් 2025.08.11 දින රැස්වී සාකච්ජා කර, ගන්නා ලද තීරණ අනුව සංශෝධනය කිරීමට යටත්ව

<u>2025.08.04 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාවේ සංශෝධිත තීරණ අංක 05</u>

මේ සම්බන්ධයෙන් පත්කල අනුකමිටුව විසින් 2025.08.11 දින රැස්වී සාකච්ජා කර, ගන්නා ලද තීරණය අනුව සංශෝධනය කිරීමට යටත්ව

<u>2025.08.04 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාවේ සංශෝධිත තීරණ අංක 06</u>

මේ සම්බන්ධයෙන් පත්කල අනුකමිටුව විසින් 2025.08.11 දින රැස්වී සාකච්ජා කර, ගන්නා ලද තීරණ අනුව සංශෝධනය කිරීමට යටත්ව

2025.08.04 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාවේ සංශෝධිත තීරණ අංක 08

මේ සම්බන්ධයෙන් පත්කල අනුකමිටුව විසින් 2025.08.11 දින රැස්වී සාකච්ඡා කර, ගන්නා ලද තීරණ අනුව සංශෝධනය කිරීමට යටත්ව

ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් සංශෝධනය කරණ ලද

පනත අනුව සැම තැනම මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරකසභාව වශයෙන් සඳහන් කිරීම කලයුතු බව.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

**02.** 2025.08.01 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාව සභාගත කරන ලදි.

ගරු සභාපතිතුමා

2025. 08.01 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

2025. 08.01 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාව සංශෝධනයට යටත්ව පිළිගැනීම සුදුසු බවට ස්ථිර කරනවා

ගරු සභාපතිතුමා

2025.08.01 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාවේ ගැටළු ගණනාවක් පවතින බව පේනවා. ඒ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ගරු මහසභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කිරීම සඳහා යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

ගරු මහසභාව කාරකසභා අවස්ථාවක් බවට පත්කරගනිමු කියල ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීම

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

ගරු සභාපතිතුමා

පැහැදිලි කිරීම අවසන් නිසා කාරක සභා අවස්ථාව ගරු මහසභාව බවට පත්කරගනිමු කියල මම යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

කාරක සභා අවස්ථාව මහසභාවක් බවට පත් කිරීමේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

කාරක සභා අවස්ථාව ගරු මහ සභාවක් බවට පත් කිරීම

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා

ගරු සභාපතිතුමනි, මේ වාර්තාවේ යෝජනා හා අදහස් දැක්වීමේදී අංක 05 යටතේ,ඉදිරියේදි සංවර්ධන යෝජනා ලබා ගැනීමේදී කොට්ඨාස භාර මන්ත්‍රීවරුන් මඟින් එම යෝජනා ලබා ගැනීම සුදුසු බවට කියලා තියෙනවා.එහි අදහස සභාවේ මන්ත්‍රීවරුන් 42 ද, 24 දෙනාද කියලා දැනගන්න කැමතියි.

ගරු සභාපතිතුමා

මෙහිදී රජය මගින් ආරම්භ කරලා තියෙනවා ග්‍රාමීය සංවර්ධන කමිටු කියලා. ඒකෙ කාර්යභාරය තමයි රජයේ නිලධාරීන් හතරදෙනාත් එකතුකරගෙන ගමේ ප්‍රමුඛ සංවර්ධන යෝජනා අරගෙන ඉදිරිපත් කිරීම.එහිදී නිලබලයෙන් කොට්ඨාශයේ මන්ත්‍රීතුමා තමයි ඒකෙ සභාපති වෙන්නේ.එතනින් පෙලගස්සාගන්න යෝජනා වසමේ ඉන්න නිළධාරියා මගින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරනවා.එතනදී ස්ථිර වන එම යෝජනා පිටපත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට,ප්‍රාදේශීය සභාවට,ග්‍රාමීය සංවර්ධන කමිටුවට සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට යනවා.මෙතනදී ගැටුමක් ඇති නොවී,එකම යෝජනාව තැන් කිහිපයකින් ඉදිරිපත් නොවී ගමේ සත්‍ය අවශ්‍යතාවය හඳුනාගැනිම සිදු කරනවා.කොට්ඨාශභාර මන්ත්‍රී විදිහට හැදින්වූවේ අපේ බලප්‍රදේශයේ කොට්ඨාශ 25 නියෝජනය කරන මන්ත්‍රීවරුන් 25දෙනා. 24 ක් එක් පක්ෂයකිනුත් මල්ලවපිටිය කොට්ඨාශයෙන් ෆාහිම් මන්ත්‍රීතුමාත් මේ ග්‍රාමීය සංවර්ධන කමිටු 25 වල සභාපතිත්වය උසුලනවා.ඔවුන් මගින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් අනුමත වුන ගමේ සංවර්ධන යෝජනා සභාවට ගෙනත් ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය කටයුතු කරනවා.

ගරු මන්ත්‍රී ඩබ්.ජයන්ත නිමලසූරිය මහතා

ගරු සභාපතිතුමනි,එම යෝජනාව ගෙන එන්න පාදක වුනේ අපි මන්ත්‍රීවරු ,ග්‍රාම නිලධාරී,රජයේ නිලධාරීන්,ගමේ ජනතාව එකතුවෙලා සංවර්ධන යෝජනා අනුපිලිවෙලක හදන කොට, උදාහරණයක් ලෙස පන්සල් වල ස්වාමීන්

වහන්සේලාගෙන් වගේ ප්‍රාදේශීය සම්බන්ධීකරන කමිටුවට එන ඉල්ලීම් වලට ප්‍රමුඛතාවයක් ලබාදෙනවා.එතකොට ප්‍රජාවගෙන් විරෝධතාවක් එනවා ගමේ හැදිය යුතුම අමාරු මාර්ග තියෙද්දි ඇයි මේ පන්සලට යන පාරම හදන්නේ කියලා.ඔන්න ඔය ගැටුමට විසඳුමක් විදිහට තමයි ගමේ ඇත්ත අවශ්‍යතාවය හඳුනන කොට්ඨාශ භාර මන්ත්‍රීවරයා දන්නවා ප්‍රමුඛතාවය ලබාදිය යුත්තේ කුමන යෝජනාවටද කියලා.මම එම අදහස දැමීමේ අරමුණ ඒකයි.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා</u>

ගරු සභාපතිතුමනි, බලප්‍රදේශයේ මිනිසුන්ගෙන් එකතුකරන බදු මුදල්වලින් හැදෙන සභා අරමුදල් ගමේ අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුත්තක් සඳහා යෙදවීම පිළිබඳ ගැටළුවක් නැහැ.නමුත් සභා අරමුදලින් වැය දැරීමට තින්දු ගන්න ප්‍රාදේශීය ලේකම්යට ඉඩලබාදීම සුදුසු නැති බවයි මගේ නම් අදහස.

<u>ගරු සභාපතිතුමා</u>

නැහැ.සභා අරමුදලින් සිදුකරන සංවර්ධන කටයුතු සඳහා තීරණ ගන්නේ අපිමයි. විමධ්‍යගත ,පළාත් නිශ්චිත හෝ රේඛීය අමාත්‍යංශ හරහා එන ප්‍රතිපාදන මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වසමක සංවර්ධන කටයුත්තක් සිදු කරනවා නම් ඒ වැඩවිෂයට ප්‍රතිපාදන අපි වෙන් කරන්නේ නැහැ.ඒ දෙපැත්තෙන්ම මුදල් වෙන් වීමේ ගැටළුව නිරාකරණය කර ගැනීමයි මෙයින් බලාපොරොත්තු වෙන්නේ.

<u>ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිර කුමාර මහතා</u>

ගරු සභාපතිතුමනි,ග්‍රාමීය කමිටු මගින් එන යෝජනා සාර්ථකයි.පසුගිය සභාව කාලයේදී අපිත් සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රිවරුන් 44 දෙනාගෙන්ම යෝජනා අරගත්තා.ඒ කාලයේ ගම්සභා ඇති කරලා තිබුනා ගමේ අවශ්‍යතාවය ඒ ගම් සබාව මගින් ප්‍රාදේශීය සභාවට මන්ත්‍රිවරුන් හරහා ගෙනැල්ලා සභා ප්‍රතිපාදන මගින් ඒවා ඉටුකලා.සභාවේ ප්‍රතිපාදන වෙන්කිරීමේදී සියළුම මන්ත්‍රිවරුන්ට සමානව ලබාදුන්නා.එහිදී කොට්ඨාශ මන්ත්‍රීද,ආණ්ඩුවේ මන්ත්‍රීද කියලා බැලුවේ නැහැ.බොහොම අවංකව,විනිවිධ භාවයෙන් යුක්තව ඒ කටයුතු කලා.රජයේ ප්‍රතිපත්තියක් තියෙනවා නම් විමධ්‍යගත ප්‍රතිපාදන,රේඛීය අමාත්‍යංශ ප්‍රතිපාදන සම්බන්ධව ග්‍රාමීය කමිටු හරහා ඒ සංවර්ධන කටයුතු කරන්න. නමුත් සභා අරමුදල් මන්ත්‍රීවරුන් 42 නා අතරම බෙදලා බලප්‍රදේශයට වැඩක් කරන්න හැමෝටම අවස්ථාව දෙන්න කියලා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා</u>

ගරු සභාපතිතුමනි,මේ සභාවට පත්වෙලා එනකොට කෙට්ඨාශ මන්ත්‍රිවරයා ලෙස පත්වෙලා එන්නේ කොට්ඨාශයේ වැඩිම මනාප ලබපු අපේක්ෂකයා.කොට්ඨාශ මන්ත්‍රිවරයාට තියෙන වගකීම ගැසට් එකෙන්ම තහවුරු වෙලා එනවා.

ගරු මන්ත්‍රී ඊ.සංජය ඇතුගල මහතා

අපි වැඩි කාලයක් හිටියෙ විපක්ෂයේ. නමුත් මන්ත්‍රිවරුනට මෙතෙක් ප්‍රතිපාදන ලබාදීමේදී කොට්ඨාශ මන්ත්‍රීද,ලස්ට් එකේ මන්ත්‍රීද කියලා බෙදීමක් තිබුනෙ නෑ.ඔබතුමා අපි හැමෝගෙම නායකයා වශයෙන් මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

මම හිතන්නේ අපේ වසම් වල ගැටළු වලින් 99.9% ක්ම අපි අරගෙන තියෙනවා. ගැටළුවක් නැහැ අපේ සියළුම මන්ත්‍රිවරුන්ටත් තමන්ගේ ප්‍රදේශයේ ගැටළු ඉදිරිපත් කරන්න පුළුවන්.අපේ බෙදිමක් නැහැ.

ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

විශේෂයෙන්ම අපේ සභාඅරමුදල හැදිලා තියෙන්නේ මේ ප්‍රදේශයේ බදු ගෙවන ජනතාවගේ බදු මුදල් වලින්.ඒ බදුමුදලින් තමයි අපි මේ වැඩක් කරන්න බලන්නේ.ග්‍රාමීය සංවර්ධන කමිටු සම්බන්ධයෙන් ඔබතුමා ඉදිරිපත් කලේ සභාවට ආව චක්‍රලේඛයක් හෝ ලියැවිල්ලක් නෙමේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආව චක්‍රලේඛයක් වෙන්න ඕනෑ.මේ දක්වා සභා අරමුදල් වලින් සංවර්ධන වැඩ කලේ සියළුම මන්ත්‍රිවරුන් එකතුවෙලා. ඔබතුමාලගේ නායකතුමා ධර්මප්‍රිය මන්ත්‍රිතුමා සම්බන්ධ වුන ව්‍යාපෘති විස්තර මගේ ලග තියෙනවා.අපි වසරකට මේ සභාවෙන් රු.200000 කට අධික දිමනාවක් ලබා ගන්නවා. අපි ඒකට ණය නොවෙන්න වැඩ කරන්න ඕනෑ.ජයග්‍රහණය කරන පක්ෂයට 100% ක් දෙනවා නම් අනිත් මන්ත්‍රිවරුන්ට 50% ක්වත් තියෙන්න ඕනෑ.පසුගය කාලය පුරාවට කිසිම බේදයක් මේ සභාව තුල තිබුනේ නෑ.අයවැයට අපි ඔක්කොම අත ඉස්සුවා.අපිව මාස්පතා ගෙන්නලා තේ එකක් දිලා දීමනාවක් දිලා නිකන් තියන්න එපා. අපෙන් වැඩ ගන්න.ඒ නිසා සභාඅරමුදලින් දෙන ප්‍රතිපාදන සියළුම මන්ත්‍රිවරුන්ට ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා මේ මොහොතේ.අපිව පැත්තකට දාල වැඩකරගෙන ගියොත් ඒ පිළිබඳවත් අපි අවශ්‍ය පියවර ගන්නවා කියලා මතක් කරනවා.

ගරු සභාපතිතුමා

මටත් යෝජනා ඉල්ලීම් එනවා නිතරම.නමුත් ඒවා කොට්ඨාශයේ යෝජනාත් සමග ගැලපිමක් සිදු කරනවා.ග්‍රාමීය සංවර්ධන කමිටුව තුලදී පස් අවුරුදු සැලැස්ම සකස් කිරීමේදී මේ සියළුම යෝජනා සලකලා බලනවා. කොට්ඨාශය තුල පදිංචි,කොට්ඨාශය නියෝජනය කරන සියළුම මන්ත්‍රීවරුන්ට පුළුවන් ඒ සඳහා සහසම්බන්ධවෙන්න.ඔබතුමා කියන විධිහට ප්‍රාදේශීය ලේකම්තුමිය කියන විධිහට නෙමෙයි,මහසභාව තුලින් තමයි සභා අරමුදල් වැය කරන ආකාරය තීරණය කරන්නේ.මහපොළවට යායුතුම නිවැරදිම තීන්දු තීරණ තමයි අපි ගන්නේ.එතනදී ගම්මට්ටමින් වසම් වම්මටින් කොට්ඨාශ මට්ටමින් තමයි ඒ යෝජනා ගන්නේ අයවැය තුලින් ප්‍රතිපාදන වෙන් කර ගැනිම සඳහා.

## තීරණ අංක 28

2025. 08.01 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව එම වාර්තාවේ පහත සඳහන් පරිදි නිර්දේශ අංක 03,11 සහ යෝජනා සහ අදහස් යටතේ අංක 05 හා 07 සංශෝධනයට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

### නිර්දේශ අංක 03

කුරුණෑගල,මාස්පොත හා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කරන යෝජනා සඳහා අනුමැතිය හා ගිවිසුම් අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා විෂය භාර නිළධාරි විසින් ලබා දුන් ලිපි කාර්මික සේවා කාරක සභාව විසින් අනුමත කරන ලදී.

| අනු අංකය | ප්‍ර.ලේ.කා | ප්‍රතිපාදන වර්ගය | වසම | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|---|---|
| 1 | මල්ලවපිටිය | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන | **732** දොරටියාව | මැල්ලගොල්ල ගම්මානයට ප්‍රවේශ වන මාර්ගය සංවර්ධනය කිරීම | **1,500,000.00** |
| 2 | | පළාත් ආයෝජන වැඩසටහන **2025** | **744** ඉඳුල්ගොඩකන්ද | ඉඳුලේගාඩකන්ද ප්‍රධාන මාර්ගයේ සිට ප්‍රාථමික විද්‍යාලය දක්වා මාර්ගය බෝක්කු යොදා අළුත්වැඩියා කිරීම | **1,000,000.00** |

| අනු අංකය | ප්‍ර.ලේ.කා | ප්‍රතිපාදන වර්ගය | වසම | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|---|---|
| **1** | මාස්පොත | විමධ්‍යගත අයවැය වැඩසටහන **2025** | **784** හංවැල්ල | තිස්සනම්පොල පාරේ සිට පඹේ හරහා ගමමැද පාර කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කිරීම | **1,000,000.00** |
| **2** | | පළාත් ආයෝජන වැඩසටහන,ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන,මූලික යටිතල පහසුකම් නංවාලීමේ හා නගා සිටුවීමේ යෝජනා **2025** | **798** කළුහෝගෙදර | කළුහෝගෙදර මොනඩැරමුල්ල පාර කොන්ක්‍රීට් දමා පිළිසකර කිරීම | **1,000,000.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **3** | මාස්පොත | පළාත් ආයෝජන වැඩසටහන,ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන,මූලික යටිතල පහසුකම් නංවාලීමේ හා නගා සිටුවීමේ යෝජනා **2025** | **788** හෙට්ටිගෙදර | හෙට්ටිගෙදර සන්බරි පෙදෙස බෝධිය අසල පාර කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කිරීම | **1,000,000.00** |
| **4** | | | | එබේවත්ත දෙවන පටුමග සංවර්ධනය කිරීම | **1,500,000.00** |
| **5** | | | | හෙට්ටිගෙදර නදී උයන පළමු පියවර පාර තාර දමා සංවර්ධනය කිරීම | **1,000,000.00** |
| **6** | | | **803** අස්වැද්දුම | අස්වැද්දුම නෙල්ලිගහපිටිය වත්ත **09** පටුමග සංවර්ධනය කිරීම | **1,500,000.00** |
| **7** | | | **798** රත්කරව්ව | රත්කරව්ව පහල වෙල පාර කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | **1,000,000.00** |
| **8** | | | **792** ගුරුලෑපොල | ගුරුලෑපොල සඳගලතැන්න පාර කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | **1,000,000.00** |
| **9** | | | **791** සියඹලාන්ගමුව | කිතුල්ගහගම මාර්ගය කොන්ක්‍රීට් දැමීම | **3,000,000.00** |
| **10** | | | | නාගස්හින්න ගුරුලෑපොල පාර තාර දැමීම | **3,000,000.00** |
| **11** | | | **780** ඔග්ගමුව | ඔග්ගමුව මෙහෙනි ආරාම පාර තාර දමා සංවර්ධනය කිරීම | **4,000,000.00** |
| **12** | | | **794** ගනේකොළණිය | ගෝවාකොටුව රඹුටන් වත්ත මාර්ගය සංවර්ධනය කිරීම | **1,000,000.00** |
| **13** | | | | ගෝවාකොටුව බෝගහ බේකරිය පාර තාර දැමීම | **1,000,000.00** |
| **14** | | | **777** පිඹුරුවැල්ලේගම | පිඹුරුවැල්ලේගම පාසල අසල සිට මැදගම දක්වා ගමමැද පාර තාර දැමීම | **4,000,000.00** |
| 15 | කුරුණෑගල | විමධ්‍යගත අයවැය වැඩසටහන පළාත් ආයෝජන වැඩසටහන ග්‍රාමීය මාර්ග සංවර්ධන | **822** විල්බාව | විල්බාව පහලගම ලිලාවති විදුහලේ ක්‍රීඩාපිටිය පසුසප මාර්ගය සංවර්ධනය කිරීම | **1,000,000.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | | වැඩසටහන | **829** බෝයගනේ | බෝයගනේ සමීර මහතාගේ නිවස අසල සිට රත්ගල්ල වසම දක්වා කුඹුරු යාය මැදින් වැටී ඇති මාර්ගයේ ඉතිරි කොටස කුඹල්පොල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | **1,000,000.00** |
| 17 | | | **828** මතව | පහල නාකලගමුව සමිතිශාලාව හරහා වැව දක්වා දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | **1,000,000.00** |
| 18 | | | | ඉහල නාකලගමුව තොටනාව මාර්ගය කොන්ක්‍රීට් කිරීම | **1,000,000.00** |
| 19 | | | **823** නයිලිය | ළිඳ කුඹුර සිට පොලගහලන්ද දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | **900,000.00** |
| 20 | | | **821** රත්ගල්ල | රත්ගල්ල දේවාල පාර කොන්ක්‍රීට් කිරීම | **1,000,000.00** |
| 21 | | | **817** හෙරලියාවල | හෙරලියාවල නිර්මල පෙදෙස මාර්ගය කොන්ක්‍රීට් කිරීම | **1,000,000.00** |
| 22 | කුරුණෑගල | විමධ්‍යගත අයවැය වැඩසටහන පළාත් ආයෝජන වැඩසටහන ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන **25** | **813** අකරගන උතුර | අකරගන උතුර ගමමැද පාර කොන්ක්‍රීට් කිරීම හා බෝක්කුව ප්‍රතිසංස්කරණය | **1,000,000.00** |
| 23 | | | **758** තලටුව | තලටුව වත්තේගෙදර මෙහෙණි ආරාමය ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම | **1,000,000.00** |

## නිර්දේශ අංක 11

2025 වර්ෂය තුල අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මාර්ග මෝටර්ග්‍රේඩර් කිරීමේ ව්‍යාපෘතියට අදාළ මාර්ග යෝජනා සඳහා වන ඇස්තමේන්තු සාරාංශය කාර්මික සේවා කාරක සභාව විසින් අනුමත කරන ලදී.

| අනු අංකය | ග්‍රා.නි. වසම | වීදි විස්තරය | මාර්ගයේ දිග(m) | පළල(m) | මුදල |
|---|---|---|---|---|---|
| **1** | මඩිතියවල | බංගලාවත්ත පළමු පටුමග (නිමල් මහතාගේ නිවස අසල සිට ලලිත් මහතාගේ නිවස දක්වා) | **300.00** | **6.00** | **24,000.00** |
| **2** | | මුරගෙදර ලඟ සිට අජිත් මයාගේ නිවස දක්වා පැමිණ සමිති ශාලාව දෙසට වන මාවත | **350.00** | **6.00** | **24,000.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **3** | | උපාලි මයාගේ නිවස අසල සිට සමරවීර මයාගේ නිවස දක්වා වන මාවත | **650.00** | **3.00** | **48,000.00** |
| **4** | දිද්දෙණිය වත්ත **- 02** පියවර | දම්මික නිවස අසල සිට යශෝධා හෝටලය දක්වා පාර | මාර්ගය කොන්ක්‍රීට් කර ඇත | | |
| **5** | | රුවන් නිවස අසල සිට අබේසිංහ නිවස දක්වා මාවත | **150.00** | **6.00** | **18,000.00** |
| **6** | | අබේසිංහ නිවස සිට ජයතිලක නිවස දක්වා මාවත | **450.00** | **6.00** | **30,000.00** |
| **7** | | හේමන්ති නිවස සිට පොදු ළිඳ දක්වා වන මාවත | **250.00** | **6.00** | **24,000.00** |
| **8** | | නුවන් නිවස සිට චානක නිවස දක්වා මාවත | **450.00** | **6.00** | **30,000.00** |
| **9** | **812,** වඳුරාගල | කුඩලුමුල්ල පාර | **300.00** | **5.48** | **24,000.00** |
| **10** | | අනුරාධා මියගේ නිවස අසල මාවත | **450.00** | **5.48** | **30,000.00** |
| **11** | **813,** අකරගන | ලයනල් මයාගේ නිවස අසල සිට සුමනදාස මයාගේ නිවස දක්වා මාවත | **200.00** | **3.00** | **18,000.00** |
| **12** | **806,** වැහැර | ගලහිටියාව පාර | **200.00** | **3.00** | **18,000.00** |
| 13 | කටුපිටිය දකුණ | ඇලිවලතැන්න මාර්ගය | **800.00** | **5.00** | **60000.00** |
| 14 | | මාරගහමුල වත්ත පාර | **200.00** | **5.00** | **39000.00** |
| | | (ගැසට් වී නොමැත) | **300.00** | **5.00** | |
| 15 | | ඇලිවලතැන්න අතුරු මාර්ගය | **700.00** | **5.00** | **51000.00** |
| 16 | තිරගම | තිරගම ස්ටේෂන් වත්ත මාර්ගය | 500.00 | 5.00 | **39000.00** |
| 17 | බෝගමුව | බෝගමුව වෙලමැද බෝගම මාර්ගය **(10ft Motor Grder)** | **700.00** | **4.00** | **45000.00** |
| 18 | රණවන | සමගි මාවත | **375.00** | **3.00** | **18000.00** |
| 19 | තෝරයාය | උඩයාර් මාවත | **300.00** | **6.00** | **14400.00** |
| 20 | හැඹව | මොරගෝල්ල වත්ත පාර | **700.00** | **3.60** | **33600.00** |
| 21 | නාරම්පොල | ඉඩංගාපොල පාර | **1500.00** | **4.80** | **72000.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 22 | **764** රන්ගම | බඹරගොඩ නදීපියස මාර්ගය | **1500.00** | **3.00** | **78000.00** |
| 23 | **764** රිකිල්ලගමුව | රිකිල්ලගමුව ජනපද මාර්ගය | **500.00** | **3.00** | **42000.00** |

| අනු අංකය | ග්‍රා.නි. වසම | වීදි විස්තරය | මාර්ගයේ දිග(m) | පළල(m) | මුදල |
|---|---|---|---|---|---|
| **1** | වේගොල්ල | පහල මාරගම මාර්ගය | **1000.00** | **6.00** | **75,000.00** |
| **2** | | පහල මාරගම මාර්ගය | **200.00** | **6.00** | **60,000.00** |
| | | **1'.6"*8'.0" -01 1'.6"*4'.0" -01** | | | |
| **3** | | පහල මාරගම අතුරු මාර්ගය | **200.00** | **4.80** | **18,000.00** |
| | | **2'.0"*8'.0" -01 1'.6"*4'.0" -01** | | | |
| **4** | මාරගම | පොදු වැව මාර්ගය(බෝක්කුව කැඩී ඇත,දෙපස කාණු කැපීම) | **200.00** | **4.80** | **30,000.00** |
| | | | **500.00** | | |
| **5** | වේගොල්ල | හබරලේ පාර වේගොල්ල | **200.00** | **3.90** | |
| **6** | ඔග්ගමුව | ඔග්ගමුව වත්ත පාර | **100.00** | **4.80** | **12,000.00** |
| **7** | ගලගෙදර | ගලගෙදර වසමේ සිට ගොකටුව දක්වා දිවෙන කෘෂි මාර්ගය හා අතුරු මාර්ග | **2000.00** | **6.00** | **150,000.00** |
| **8** | මාරගම | මාරගම පොතුගස්වැව මාර්ගය (දෙපස කාණු පමණී) | **300.00** | **6.00** | **30,000.00** |
| **9** | | | **400.00** | **2.00** | |
| **10** | | මාරගම ඔය මාර්ගය | **200.00** | **4.80** | **18,600.00** |
| **11** | මිංහෙට්ටිය | වැවේ වත්ත මාර්ගය | **450.00** | **4.80** | **33,600.00** |
| **12** | මිංහෙට්ටිය | මිංහෙට්ටිය ඉහල ගම පල්ලේවෙල මාර්ගය | **450.00** | **6.00** | **40,200.00** |
| **13** | ගනේගොඩ | ගනේගොඩ පැල තවාන පංසල මාර්ගය | **600.00** | **6.00** | **51,600.00** |
| **14** | ගෝනගම | ගෝනගම වෙල මැද මාර්ගය | **700.00** | **6.00** | **58,800.00** |
| **15** | ගෝනගම | රංගම ගෝනගම මාර්ගයේ සිට ප්‍රේමේ මුදලාලිගේ කොන්ක්‍රීට් වැඩපල දක්වා මාර්ගය | **100.00** | **4.80** | **12,600.00** |
| **16** | ගෝනගම | රංගම පාරේ සිට ගෝනගම වැව අසලින් හැලව දක්වා මාර්ගය | **600.00** | **4.80** | **42,600.00** |
| **17** | ගෝනගම | රංගම පාරේ පහල සුසන්ත මහතාගේ නිවස දක්වා මාර්ගය | **100.00** | **4.80** | **12,600.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 18 | ගෝනගම | ගෝනගම සමුපකාරය අසලින් මාර්ගය | 150.00 | 6.00 | 17,400.00 |
| 19 | ගෝනගම | නිසලතැන්න වෙන්දේසි ඉඩමේ ප්‍රධාන මාර්ගය හා අතුරු මාර්ග | 800.00 | 6.00 | 66,600.00 |
| 20 | කලොහගෙදර | බදුවත්ත නිවාස පිටුපසින් වෙල දක්වා මාර්ගය | 300.00 | 4.50 | 23,400.00 |
| 21 | හංවැල්ල | නේවර්සිටි අතුරු මාර්ගය | 900.00 | 7.50 | 90,600.00 |
| 22 | කුඩාගල්ගමුව | පහල වලව්වත්ත මාර්ගය | 100.00 | 4.80 | 12,600.00 |
| 23 | ඔග්ගමුව | ජයසිරි මහතාගේ නිවස අසල මාර්ගය | 120.00 | 6.00 | 15,600.00 |
| 24 | කුඩාගල්ගමුව | අලවත්ත මාර්ගය කුසුමාවති නිවස අසල සිට වෙල්යාය දක්වා මාර්ගය | 200.00 | 4.80 | 18,600.00 |
| 25 | කිඩපොල | පැපලේවල වත්ත අතුරු මාර්ගය | 530.00 | 6.00 | 46,200.00 |

<u>යෝජනා සහ අදහස් යටතේවන සංශෝධන</u>

05. ඉදිරියේදි සංවර්ධන යෝජනා ලබා ගැනීමේදී කොට්ඨාස මට්ටමින් එන යෝජනා ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ජයන්ත නිමලසූරිය මහතා විසින් යෝජනා කරන ලදී.

07. නඩත්තු ඒකකයක් පිළිබඳ ගරු මන්ත්‍රී පී.බී.ප්‍රේමදාස මහතා විසින් කරනු ලැබූ විමසීමට ගරු සභාපති තුමා විසින් 2026 වර්ෂයේ අයවැය ලේඛණයට නඩත්තු ඒකකයක් සඳහා වැය ශීර්ෂයක් වෙන් කල යුතු බවත් ඒ සඳහා සුදුසු ඉඩමක් තෝරා ගැනීම කල යුතු බවත් ව්‍යාපෘති වාර්තාවක් හා ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරි කමිටුවකට යොමු කරන ලෙස සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

03. 2025.07.24 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව සභාගත කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

2025.06.25 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය</u>

2025.07.24 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට ස්ථිර කරනවා

ගරු මන්ත්‍රී කේ.පී.ජී.කුමාර බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි,මෙම වාර්තාවේ 13 වන තීරණයට අනුව එම සූකර ගොවිපලවල් වල පාරිසරික ගැටළු පවතින බව ඇත්ත. නමුත් එකපාරම ඔවුන්ගේ ව්‍යාපාර නවත්වන්න බැහැ.පැටව් ඉන්නවා.ගැබිනි සතුන් ඉන්නවා.අත්හිටුවීමට ඔවුන්ට කාලයක් දිය යුතුයි.දැනට සූකර කොටු 03යි තියෙන්නෙ.ඉන් දෙකකට සත්වජ බලපත්‍ර තියෙනවා.සත්වයන් ලියාපදිංචි කරල තියෙනවා.පරිසරයට ඇති වන බලපෑම් සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගැනීම ගැන එකඟ වනවා.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි,සභාවේ අපි කණ්ඩායමක් මෙම ස්ථාන පරීක්ෂා කලා. හරිම අප්‍රසන්න,අපරික්ෂාකාරී,අපද්‍රව්‍ය රැස්වෙන,පාරිසරික ගැටළු ඇතිවන ආකාරයෙන් තමයි ඔවුන් කටයුතු කරමින් සිටින්නේ.ඔවුන් පාරිසරික බලපත්‍රය ලබාගෙන තියෙනවාද කියලා නැවත පරීක්ෂා කරන්න ඕනෑ. 2002,2003 ඉදන් තමයි මේ ගැටළුව එන්නේ.

ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා

ගරු සභාපතිතුමනි,නවත්වන්නේ අවිධිමත් නම්නේ.බලපත්‍රයක් ගන්නකොට නිතිරීති රාමුවක් තුල විධිමත්ව පවත්වාගෙන යන්න උපදෙස් දෙනවා.එකපාරට මේවා වහන්න පුලුවන් කමක් නෑ.බලපත්‍රයක් දිල තියෙනවා නම් විධිමත් පරිදි කටයුතු කරන්න කියලා උපදෙස් දෙන්න විතරයි අපිට පුළුවන් කියලා මම හිතනවා.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

2002,2003 ඉදන් තමයි මේ ගැටළුව එන්නේ.අපි පරීක්ෂා කරනවා.ලිපියක් යවනවා. නමුත් ගැටළුව එතනමයි.ඒ නිසයි අපි ඒ තීරණය ගත්තේ. 2003 සිට එන ගැටළුවට ඒ තීරණය නොගෙන මොන තීරණයද ගන්නේ කියන එක මට ප්‍රශ්ණයක්. 2003 සිට මේ දක්වා මිනිස්සුන්ට,සත්තුන්ට ඇති වෙලා තියෙන පීඩාව වලක්වන්න ඕනෑ නිසා තමයි මේ තීරණයට එළඹුනේ.මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුනුත් මේක පරීක්ෂා කරලා අවශ්‍ය උපදෙස් ලබාදීල තියෙනවා.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර සංජීව මහතා

ගරු සභාපතිතුමනි,සත්ව පාලනයේ අභ්‍යන්තර ක්‍රමවේදයට මැදිහත් වෙන්න නම් අපට බැරි වෙයි.අදාල දෙපාර්තමේන්තු සම්බන්ධ කරගන්න වෙයි.සභාවට කරන්න පුළුවන් පරිසරයට හා ඒ අවට ජනතාවට වන හානිය සම්බන්ධයෙන් කටයුතු කිරීමයි.

ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිරකුමාර මහතා

ප්‍රාදේශීය සභාව,මධ්‍යම පරිසර අධිකාරිය ,මහජන සෞඛ්‍ය පරීක්ෂක වගේ ආයතනත් එක්ක එකතු වෙලා තමයි පරිසර බලපත්‍රය ලබාදීමේදී කටයුතු කරන්නේ.මේ බලපත්‍රය ලබාදීමේදී ලබාදෙන උපදෙස් දිගින් දිගටම පැහැර හරිනවා නම් සභාවක් විදිහට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුළුවන්.හැබැයි ඒ තීරණය බලපත්‍රය ලබාදීමේදී සම්බන්ධ වන සියළුම ආයතන එකතු වෙලා තමයි ගන්න තීරණයක් බවට පරිවර්ථනය වෙන්න ඕනෑ.නමුත් මම

හිතනවා අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේ ඔවුන්ට පොඩි කාලයක් දෙන්න ඒ සත්තුන්ගේ කාලය අවසන් වනතුරු.ඒ කාලය තුල ඔවුන් විධිමත් වුනේ නැත්නම් නිතිමය ක්‍රියාමාර්ගයකට යමු කියලා යෝජනා කරනවා.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි,මේ එක සූකර ගොවිපලකටවත් පරිසර බලපත්‍ර ලබාගෙන නෑ.පරිසර බලපත්‍ර ලබා දීමට අවශ්‍ය අවශ්‍යතාවයන් පිළිබඳ උපදෙස් ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිතරම ලබාදිලා තියෙනවා.නමුත් ඒ උපදෙස් ඔවුන් පිළි පැදලා නැහැ.ඒ නිසයි මේ තීරණය ගන්න වුනේ.

තීරණ අංක 29

2025.07.24 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව එම වාර්තාවේ 13 තීරණය පහත පරිදි සංශෝධන සහිතව පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

2025.07.24 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාවේ සංශෝධිත තීරණ අංක 13

හැගව මොරගොල්ල ජනපදයේ අනවසරයෙන් පාරිසරික ගැටළු ජනනය කරමින් අවිධිමත්ව පවත්වාගෙන යනු ලබන සූකර ගොවිපලවල් සම්බන්ධව අවස්ථා කීපයකදිම ගොවිපලවල කටයුතු තාවකාලිකව අත්හිටවන ලෙස අවසන් සිහිකැඳවීම්ද යොමු කර ඇතත් මෙතෙක් එම නියෝග නොසලකා හැර දැඩි පාරිසරික දූෂණයක් ජනනය කරමින් අප්‍රසන්නව සූකර ගොවිපලවල් පවත්වාගෙන යන බැවින් ටී.එම්.කේ.දූෂාන් නෙරන්ජන් මයා,ධම්මික සරත් කුමාර මයා සහ රංජිත් ප්‍රේමලාල් මයා යන නම් සඳහන් ගොවිපල හිමිකරුවන්ට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ගයකට ගැනීමට පෙර.අනුකමිටුවක් පත්කරල එම කමිටුවේ නිර්දේශත් සමග, මේ සම්බන්ධව කටයුතු කරන අනෙකුත් රාජ්‍ය ආයතනත් කැඳවලා මෙම සූකර ගොවිපලවල් සම්බන්ධව සහ පොදුවේ මෙවැනි පැනනගින ගැටළු සම්බන්ධව තීරණයක් ගෙන එම වාර්තාව ඊලග පරිසර හා පහසුකම් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා විය.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය

04. 2025.07.24 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා

2025.07.24 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා

ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

2025.07.24 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සංශෝධන සහිතව පිළිගැනීම සුදුසු බවට ස්ථිර කරනවා.එම වාර්තාවේ තීරණ අංක 11 ට වැඩසටහන සකස් කිරීමේදී කථික තරඟය යන්න අතහැරී තිබෙන අතර නව නිර්මාණ නොව සාමාජිකයන් අටදෙනෙකුගෙන් සමන්විත කෙටි නාට්‍ය තරගයක් වශයෙන් ඇතුලත් වියයුතුයි.

## තීරණ අංක 30

2025.07.24 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව එම වාර්තාවේ තීරණ අංක 11 හි සඳහන් වැඩසටහනට කමිටුව විසින් සාකච්ඡා කල සියළුම තරඟ ඉදිරිපත් කර ඇති බැවින් 2025.07.24 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සංශෝධන රහිතව පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

මාසික ආදායම් වියදම් වාර්තා සභාගත කිරීම

2025 ජූලි මාසයට අදාල ආදායම් වියදම් වාර්තා, 2025 ජූලි මාසයට අදාල ආදායම් වියදම් පුරෝකථන වාර්තා සහ හිඟ ආදායම් වාර්තා දැනුවත් වීම සඳහා සභාගත කරන ලදී.

## වෙනත් කරුණු

ගරු මන්ත්‍රී එස්.ඒ.යූ ප්‍රේම් කියාස් මහතා

මීට වසර 12 කට පෙර තලටුව ගල්වලපිටිය මාර්ගයේ ගම්පෙරලිය යටතේ මධ්‍යම රජයෙන් ඉන්ටලොක් ගල් ලක්ෂ 10 ක විතර අල්ලලා තිබුනේ.අද වෙනකොට ඒ ගල් ඉවත් කරලා තියෙන්නේ.ඒ ගල් කොතනද තියෙන්නේ කියලා දන්නේ නෑ.සභා අනුමැතිය ඇතුවද නැතිනම් ලොග් පොතේ සටහන් කරලද එම ගල් ඉවත් කිරීම සිදු කලේ කියලා දැනගන්න කැමතියි.

ගරු මන්ත්රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු ආණ්ඩාකාරතුමාත්,ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ධර්මප්‍රිය මන්ත්‍රීතුමාත් නිරීක්ෂණ චාරිකාවක ගිය වෙලාවක ප්‍රදේශවාසින්ගේත් විහාරස්ථානයේත් ඉල්ලීමක් මත දැනට මාස 04 කට පමණ පෙර මේ පාර කාපට් කිරීම සඳහා තීරණය කරලා තියෙනවා.ඒ පාර යම් යම් ස්ථානවලින් කැඩිලා තියෙනවා.එම නිසා ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා.අපි යෝජනා ඉදිරිපත් කරපු වෙලාවක කාපට් කිරීම සඳහා ලක්ෂ 295.2 ක් වෙන්කරලා තියෙනවා. ඒ නිරීක්ෂණ චාරිකාවේදී **RD** එකෙන් කියලා තිබුනා මේ පාර මුල ඉඳන්ම හැදෙන්න ඕනෑ.ඒ කැට ටික ඉවත් කරන්න කියලා.ඒ කැට ඉවත් කිරීමේ නියෝගය දීලා තියෙන්නේ සම්බන්ධීකරණ කමිටුවේ

සභාපති.............(පැහැදිලි නෑ).පසුව ඒකෙ ලියවිලි ටික හැදිලා තියෙනවා.ඒ ලියකියවිලි ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කරන්න පුළුවන්.ඒ ඉවත් කරපු කැට දැනට ප්‍රදේශයේ විහාරස්ථානයක තැන්පත් කරල තියෙනවා.

ගරු මන්ත්‍රී බී.එම්.කුමාරදාස මහතා

ගරු සභාපතිතුමනි,අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට ගැටළුවක් තියෙනවා ඔවුන්ගේ හැඳුනුම්පත්,ලෙටර්හෙඩ් ටික.කලින් නම් පළමු මාසය තුලම ලබලා දුන්නා.ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමන්ලාගේ හැඳුනුම්පත්,නාමපුවරු සම්බන්ධයෙන් පොඩි ගැටළුවක් තියෙනවා.මිලගණන් කැඳවීමේදී ලැබී ඇති මිලගණන,වෙළඳපලේ සාමාන්‍ය මිලගණනට වඩා අසාමාන්‍ය ලෙස වැඩියි.මේ හැඳුනුම්පත් ඉතාමත් ඉක්මණින් ලබාදිය යුතු නිසා දැනට යෝජනා වෙලා තියෙන්නේ ඒ ලැබී තියෙන මිලගණනටම හැඳුනුම්පත් සකස් කිරීමටයි.

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මහතා

ගරු සභාපතිතුමනි,පසුගිය සතිය තුල අපේ ග්‍රාමීය මාර්ග වල කියුබ් 03 ට වැඩි වාහන ගිහින් පාරවල් කීපයක්හානි වුනා.මේ නිසා ගම්වාසීන් සහ අපි අතර ගැටුම් ඇති වෙනවා.ඒ පාරවල් වල තත්වය සහ පාරට ඇතුලත් කල නොහැකි බර ප්‍රමාන ඇතුලත් බෝඩ් දාගන්න පුළුවන් නම් එක වැදගත්.යමක් වුනාට පස්සේ එන සිදුවීමට වැඩිය ඒක වලක්වා ගන්න පුළුවන් නම් හොඳයි.දෙවැනි කාරණය රාජ්‍ය සේවකයින් නෙමෙයි කාට වුනත් අපිට තියෙනවා වගවීමක් සහ වගකිමක්.ගියසතියේ හතරවෙනිදා මට විදුලි සේවකයො ලබලා දෙන්න දිනය දාලා තිබුනා.එදා වාහන දෙක තුනම තිබුනේ නැහැ.සාමාන්‍ය ආයතනයක වැඩකරද්දි ඇක්ටින් මැනේජ්මන්ට් එකක් තියෙන්න ඕනෑ.මේ ගැන සැලකිලිමත් වෙන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එකෙන් වෙන්නේ අපේ වැඩසැලසුම් කරගන්න බැරිවෙන එක.ඊලග කාරණය තමයි අපි උපසභාපතිතුමිය සමග කුඩාගල්ගමුව උපකාර්යාලය නිරීක්ෂණය කිරීම සඳහා ගියා එහිදී ලක්ෂ එකහමාරක් විතර වියදම් කරලා නළ ලිදක් සවිකරලා තියෙනවා. තාම වතුර මෝටරයක් සවිකරලා නැහැ. මම කිහිපවතාවක් කාර්යාලය දැනුවත් කලා. මම ඒකයි කියන්නේ වගවීම සහ වගකීම මීට වැඩිය දැනුවත් විය යුතුයි කියලා. අපේ නිරීක්ෂණ චාරිකාවකදී හඳුනාගන්නා අඩුපාඩුවක්වත් මාසයකට කිට්ටු කාලයක් වෙලත් හැදෙන්නේ නැතිනම් අපි වැඩකරන්න ගන්න උත්සාහය අපතේ යාමක් වෙනවා.ඒක එච්චර හොඳ දෙයක් නෙමෙයි කියලා මම යෝජනා කරනවා.අනිත් කාරණය තමයි පසුගිය සභාවාරයේදී කථා කලා ලැප්ටොප් වර්ගයේ පරිගණකයක් අස්ථානගතවීමක් ගැන.එහිදී මම ඉල්ලීමක් කලා පරිගණක පමණක් නෙමෙයි ඉන්වෙනට්‍රිගත සියළුම භාණ්ඩ පිළිබඳව පරීක්ෂාවක් කරලා දෙන්න කියලා.මොකද මේවා මහජනයාගේ දේපල අපට මේ සියල්ල ගැන තොරතුරු දැනගන්න අවශ්‍යයි කියලා. අපි සති දෙකක් ඇතුලත වාර්තාවක් ඉල්ලුවා මේ ලැප්ටොප් එක සම්බන්ධයෙන්.අපි කථා කරලා දින කීපයක් යන්න කලින් පරිගණකයට අදාල මුදල මේ ප්‍රාදේශීය සභාවට ලැබිලා තියෙනවා.මෙවැනි ගැටළුකාරී තත්වයක් තියෙන කොට ඒ මුදල භාර ගත්තේ කවුද?මොකද්ද පදනම? මේ ගැන

මුලින් කිව්වේ සභාව මේගැන දැනගෙන හිටියේ නෑ කියලා මේ සම්බන්ධයෙන්.නමුත් එහෙම සිදුවීමක් වෙලා තියෙනවා,මුදල් භාරගෙන තියෙනවා.මේ ගැන අපිට වාර්තාවක් ලැබිලා නැහැ අද වෙනකම් මොකද වුනේ කියන එක.ඉක්මන් පරීක්ෂණයක් අවශ්‍යයි කියලා අපි මුලින්ම කිව්වා. ඒක දැනුත් කියනවා. මොකද ඒක රජයේ දේපලක් .මේකට අධිභාරයක් එකතුවිය යුතුයි.ඒ සම්බන්ධව නිති පනත් වල සඳහන්. ඒ නිසා මේ සම්බන්ධව වැඩිපුර සොයා බලන්න වෙයි කියලා මම ඔබතුමාට මතක් කර සිටිනවා.අපි ඉල්ලලා තිබුනේ බාහිර පරීක්ෂණයක් මේ මහසභාවේ සියළුම දෙනා බලාගෙන ඉන්නවා ඒ පරීක්ෂණ වාර්තාව සම්බන්ධව ගරු සභාපතිතුමනි.

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා</u>

ඔය ලැප්ටොප් එක සම්බන්ධව ගරු සභාපතිතුමනි කමිටුවක් පත් කරලා තිබුනා.එම කමිටුව මේ මහසභාවේ හෝ ඔබතුමාගේ දැනුවත් විම මත ඇතිකල කමිටුවක්ද, ,එයින් වාර්තාවක් දුන්නද මේ මුදල් ගෙවන්න කියලා, එම කමිටුව බලාත්මක කමිටුවක්ද ඒ තින්දුව ගන්න තරම්,ඒ මුදල ගත්ත එක නිවැරදිද,කියන එකත් එක්ක.අනිවාර්යයෙන්ම ඊලග කමිටුවට පෙර මේ සම්බන්ධව ඔබතුමා කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.ජයන්ත නිමලසූරිය මහතා</u>

ගරු සභාපතිතුමනි, මහජනතාවට සේවය කිරීමයි අපේ පරමාර්ථය. නමුත් ආධාරයක් හෝ සහනයක් දෙනකොට ඔවුන් පීඩාවට පත්වන අයුරින් විශාල වශයෙන් ලිපිලේඛණ, නිර්දේශ,අනුමත අත්සන් ඉල්ලා සිටිනවා උදාහරණ ලෙස වැසිකිලි ආධාර ලබාදීමේදී විශාල විස්තරප්‍රමාණයක්,ලිපිලේඛණ, විවිධ පාර්ශවයන්ගේ අත්සන් අනුමැතින් අවශ්‍ය කරනවා.එක් අසරණ මනුස්සයෙක් වැසිකිලි ආධාර ඉල්ලනවා ඔහු නමට ඉඩමේ ඔප්පුව නැහැ.නිතිමය තත්වයනුත් සලකා බලල මෙම කොන්දේසි අවම කර අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය ලබල දීලා අසරණ මිනිසුන්ට උදව් කිරීමට හැකිවන ආකාරයක් සලසන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා</u>

රජයේ නිතිරීති,රෙගුලාසි අනුව තමයි තනිතනි පුද්ගල ප්‍රදාන කරනු ලබන්නේ.එහෙම නැත්නම් විගණනයට භාජනය වෙනවා.උදාහරණ වශයෙන් වැසිකිලියකට ආධාරයක් දෙනකොට ඉඩමේ ඔප්පුව අත්‍යාවශ්‍ය ලියකියවිල්ලක් වෙනවා. අපේ පැත්තෙන් ලියකියවිලි වලින් සහනයක් දෙන්න පුළුවන්ද කියලා සොයා බලමු.ඊට අමතරව යොහාන් මක්ත්‍රිතුමා ඉදිරිපත් කල ඒ අදහස හා යෝජනාව සම්බන්ධයෙන් ,නිලධාරීන්ගේ ක්‍රියාකලාපය තුල මහසභාව හැල්ලුවට ලක් කිරීම හා නොසැලිකිලිමත් භාවය සම්බන්ධයෙන් ලිඛිතව හෝ වාචිකව ක්‍රියාමාර්ගයක් ගන්න වෙනවා.ඒත් එක්කම සභාවේ කුදුමහත් සියළුම කටයුතු සම්බන්ධවම සභාපති විධිහට සියල්ලම ගැන සොයාබැලීමේ අවකාශය අඩුයි.ඒ නිසා මගේ පහසුව තකා මන්ත්‍රී කණ්ඩායමක් පත්කරගන්නවා විෂයන් ගැන ගැඹුරින් සොයා බලල නියාමනය හා මහජන සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම සඳහා.එම කණ්ඩායමට තවත් සහය අවශ්‍ය නම් තවත් මන්ත්‍රීවරුන් ඒ සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වෙනවා.ඔබතුමාගෙ ගැටළු වැනි තත්ව ඉදිරියේදී සිදු නොවෙයි කියන විශ්වාසය මා ලග තියෙනවා.ලැප්ටොප් එක සම්බන්ධ කාරණාවේදී බාහිර විමර්ශණයක් සිදුකිරීම සඳහා මුදල්

කමිටුවේදී තීරණය වෙලා ඒ සඳහා මහසභා අනුමැතියත් ලැබුනා. ඒ කමිටුපත් කිරීම බලාත්මකද යනාදී කාරණා සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා විසින් පත්කරණ විමර්ශණ කණ්ඩායම විසින් සොයා බලල තීරණය කරයි.එම විමර්ශණ වාර්තාවට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනිමු.

ගරු මන්ත්‍රී එච්.එම්.එච්.කීර්ති හේරත් මහතා

ගරු සභාපතිතුමනි, මේ සභාව ආවරණ කිරීම සඳහා උගත් බුද්ධිමත් මාධ්‍යවේදීන් සහභාගි වෙනවා. නමුත් ඔවුන්ගේ වාර්තාකරණයේදී සාවද්‍ය තොරතුරු පුවත්පත් වල පලවෙනවා. ඔබතුමාගේ නමත් අජිත් ගුණතිලක කියල තමයි සඳහන් කරලා තිබුනේ. මගේ පක්ෂයත් වෙනස් කරලා දාල තිබුනා. මිනිස්සු අහනවා පක්ෂය මාරු කලාද කියලා. එයින් අපි අපහසුතාවයට පත්වෙනවා.මේ ගැන ඔවුන් දැනුවත් කරනවා නම් හොඳයි.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි,අපි පසුගිය සභාවේදී ක්‍රියාත්මක කලයුතු විශේෂ යෝජනා කීපයක් ඉදිරිපත් කලා.එම යෝජනා ක්‍රියාත්මක වෙලාද,ඒවායේ ප්‍රගතියක් තියෙනවාද කියලා මම දැනගන්න කැමතියි.විශේෂයෙන් ඉන්ධන,වාහන නඩත්තු ,ඉඩම් සම්බන්ධ තීරණ වල ප්‍රගතිය දැන ගන්න කැමතියි.

ගරු සභාපතිතුමා

2018 සිට 2022 වර්ෂය දක්වා මාසිකව වාහනයෙන් වාහනයට ඉන්ධන සහ නඩත්තුව සම්බන්ධ වාර්තා ඉදිරිපත් කරලා තියෙනවා. අවශ්‍යතාවය අනුව පරිහරණයට ගනිමු. ඉදිරි කාලය තුල අදහස් කරනවා මහසභා, කාරක සභා වල තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචන සාකච්ජාවක් ගන්න.මන්ත්‍රීවරුන් සියළු දෙනාගේ සහයත් ඇතිව මේ කමිටු, මහසභා තීරණ ක්‍රියාත්මක කරගෙන යද්දී මේ සභාව පහසු හා නිවැරදි පාරකට වැටෙයි කියලා මම විශ්වාස කරනවා.ඉදිරි කාලය තුල අපි වැඩ ගොඩක් සංවිධානය කරගෙන තියෙනවා. සියළුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඇතිව එම කටයුතු සාර්ථකව කරගෙන යාමට ලැබෙයි කියලා හිතනවා.විශේෂයෙන්ම නිවේදන යටතේ දැන්වූ පරිදි සාරගම වැව ආශ්‍රිත ඒ කටයුත්ත. ආයතන විශාල ප්‍රමාණයක් සම්බන්ධ වෙලා කරන ඒ ව්‍යාපාතිය සඳහා පක්ෂ විපක්ෂ බේදයකින් තොරව අවශ්‍ය සහයෝගය ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා.ඒ වගේම ඉදිරියේදී අයවැය සකස් කිරීමක් අපි සිදු කරනවා.එහිදී ලැබෙන සියළුම යෝජනා අතරින් අපට තියෙන ප්‍රතිපාදන සීමාව තුල ගැලපීමට අදහස් කරනවා.ඒකෙදි අපේ බලප්‍රදේශයට අත්‍යාවශ්‍යම වන කාරණා තමයි මේකට යොදා ගන්නේ.සෑම ගමකටම,සෑම වසමකටම,සෑම කොට්ඨාශයකම සිටින ජනතාවට සාධාරණයක් යන පරිදියි ඒ අයවැය ප්‍රතිපාදන මුදා හරින්න අපි කටයුතු කරන්නේ.විශේෂ ස්ථාන එන්න පුළුවන් .ගෝනගම,වැල්ලව ප්‍රධාන උපනගර විධිහට සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් මධ්‍යම රජයත් එක්ක එකතුවෙලා වැඩපිළිවෙලක් සකස් කරන්න සැලසුමක් තියෙනවා.ඊට අමතරව ජංගම සේවා මාසෙකට දෙකක් සිදු කිරීමට අපි සැලසුම් කරලා තියෙනවා. ඉදිරියේදී ලැබෙන අත්දැකීම එක්ක මාසෙකට ජංගම සේවා හතරක් දක්වා වැඩි කරන්න පුළුවන් වෙයි. ලොකු වියදමක් යන්නේ නැහැ මේ එක වැඩසටහනකට ගියේ රු.26000.00 ක පමණ මුදලක්. නමුත් ඵලදායී වැඩසටහනක්

සිදුවෙනවා එහිදී. සියළුම සම්පත් එක තැනකට එකතු කර,වෙනත් ආයතන වල දායකත්වයත් ලබාගෙන තමයි සිදු කරන්නේ.එවා සදහා අදාල කොට්ඨාශයේ සියළුම මන්ත්‍රීවරුන්ට සහභාගි වන ලෙස ආරාධනා කරනවා.බලප්‍රදේශයේ සිටින සියළුම පුරවැසියන්ගේ සියළුම ප්‍රශ්ණ වලට මැදිහත් වී විසදුම් ලබා දීම තමයි මේ සිටින සියළුම මන්ත්‍රිවරුන්ගේම ප්‍රාර්ථනාව,අරමුණ. ඒ නිසා ඒකට බේදයකින් තොරව සියළුම දෙනා ස්බන්ධ වෙමුයි කියන ආරාධනාවත් සමග අද දවසේ සභා කටයුතු අවසන් කරනවා. ඔබ සැමට බොහොම ස්තූතියි.

මහ සභා රැස්වීමේ කටයුතු පස්වරු 15.55 ට අවසන් කරන ලදී.

........................................

සභාපති,

කුරුණෑගල ප්‍රාදේශීය සභාව.